Campbell

107.

a lot got from Dean Butcher who got them from the widow of the translator.

J F Campbell

November 3. 1882

August 2 1881. Folk Lore From G W R Campbell

G. W. R. Campbell

# ATHETHA WAKYA DEEPANYA

OR

## A COLLECTION OF

## Sinhalese Proverbs, Maxims, Fables &c.

COMPILED AND TRANSLATED INTO ENGLISH

BY

ALEXANDER MENDIS SENANAYAKA

ARATCHY.

---

# අතීත වාක්‍ය දීපනිය

හෙවත්

පුරාණ සිට ව්‍යවහාරවූ

සිංහල උපමා කියමන්.

මොරටුවේ පදින්චි

අලෙක්සන්‍ද්‍ර මැන්දිස් සේනානායක

ආරච්චි විසින්

සංග්‍රහකොට ඉංග්‍රීසි බසට නගණලදී.

[*All Rights reserved.*]

PRINTED AT THE CATHOLIC PRESS, COL:

Sinhalese folk-lore

A. MENDIS MOROTUWA

# ප්‍රාරම්භය.

මේ පොතට අන්තර්ගතකර තිබෙන වාක්‍යයන් බොහෝ සෙයින්ම උපමා කථා බව පෙනේ-නොයෙක් භාෂාවලින් ව්‍යවහාරවූ නොයෙක්මත මෙහි වාක්‍යයන්හි පෙනේයි-'ලුලා නැති වලට කණයා පණ්ඩිතයා' යන්නද-'තිකම් පනින රිලවාට ඉනිමං බැන්දා වගෙයි' යන්නද-'ඇතිවෙන ගහ දෙපෙත් තෙන් දැනෙයි' යන්නද-මෙනාදි සම්භරකිම් දෙමළ ව්‍යවහාරයෙහි පවා දක්නා ලැබෙයි-'ගිණ්නක් නැතුව දුමක් නැත්ලු' යන්නා නොයෙක් භාෂාවලින් බාහුල්‍ය ව්‍යවහාරයට නැගී පවත්නා තර්ක ශාස්ත්‍රයෙහිවූ වැදගත් කිවකි-'කුණුමාලු ඔතාපු කොළේ වගෙයි' යන්න 'පූතිමච්ඡං කුසග්ගෙන' යනාදි වශයෙන් දුර්ජනයන් ආශ්‍රයකිරීම කුණු මස් බැඳි තණපත් හා සමානයයි බුද්ධ ධර්මයෙහිද ප්‍රකාශයි-'කකුළුවා දිය රත්වෙනකල් තරණ සෙල්ලම වගෙයි'-යන්න 'ලිප ගිණි මොලවනතෙක් දිය සැලියේ- සැපයක්මෙන් කකුළුව ඉඳ තෙළියේ'යි-ලෝවැඩ සඟරාවෙහිද කියා තිබේ-'ඉබ්බාට කටරොතනය ඉන්ට බැරිවුනා වගෙයි' යන්නා ප්‍රකාශවූ කථාව විෂ්ණුශර්මන් නම් පණ්ඩිතයා ගේ හිතෝපදේශ ග්‍රන්ථයෙහි හා පඤ්චතන්ත්‍රයෙහිද ජාතක අටුවාවෙහිද ප්‍රකාශිතයි-'ගෙයි මස් ගඳ තිබෙන තෙක් දොරකඩ බළහඩ නොරනොවෙයි' යන කිම ප්‍රතිනීතිමත් ජාකොබ්ද ගොන්සාල්වේස් නම් ධර්මාචාර්ය්‍යවහන්සේ විසින් කළ ආනාඥකලිප්පුව නමැති පොතෙහි පවා ප්‍රකාශයි-මෙසේ ප්‍රශස්ත දනුමැතිකම් හා ලෝක චාරිත්‍ර ධර්මාදි අනන්ත කරුණු දැනගැණිමටත් කථාව සැරසීමටත් ප්‍රයෝජනවත්වූ මේ කුඩා පොත ලෝකයා විසින් සිත් එළවීයයුතු එකක් බව සලකණු ලැබේවා.

යලිදු-වැදගත් සිංහල උදාහරණ සහිව ඉංග්‍රීසි බසට
රුව් පරිද්දෙන් භාෂා කවීතාරණ්ට සාහිලාසවූ ආධුනි
ක ජනයාට හා, සිංහල උදාහරණ කිමක් නමත් කවී
වා ගොදා පවත්නු නැමතිව් ඒගැණ මනක තිබෙන
පමණ්ත් සෙවූ නොගෙනහිම බලාගණ්ට තිබෙන මේ
ඉපාතෙන් සාමාන්‍ය ජනයාට බොහෝ ප්‍රයෝජන ලැ
බේයයි මාගේ යටත් කල්පණවයි.

මෙම පොතේ මුල් පිටපත නැසියිය මගේ ආදර
ණීය පියාහාණ්වන අදිරියත්ද මැත්දියි සේනානාය
ක මොරටුවේ මුදලි තුමන් විසින් මී ට පසලොස් අවු
රුද්දකට පමණ පූර්ව යඩගුනතර සිංහලෙන් ප්‍රසිද්ධ
කරණ ලද්දේය-එය බොහෝදෙනා විසින් සතුටු සිත්
වඩා පිළිගත් හෙයින් පලමු පොතේ නොතිබුන වෙ
නත් නාම සියගණනක් මීට එකතුකොට ඉංග්‍රීසි භාෂා
වට නගා මා හැකි තරමින් වෙනෙසගෙණ යලිත් වැ
දගත් පණ්ඩිත මහතුන් ගිපදෙනෙකුගෙන් ආධාර
ලබාගෙණ දෙවෙණි වරට ප්‍රසිද්ධකෙලෙම්-මෙහි ඇති
යම් ප්‍රමාද දෝෂ තිබේන්ට බැරි නැත-පණ්ඩිතොත්තම
මසේ ඒවා නිගාකොනර මගේ දුර්ල උත්සාහයට
සතුටුවේන්නයයි ප්‍රාර්ථනාකරමි.

A. Mendis,

*Aratchy.*

# PREFACE.

The following work is a collection of proverbs, maxims, fables &c. (current at the present day among the Sinhalese), the majority of which have been handed down orally from time immemorial. A few however are of recent introduction as is evidenced by their form, though their origin is beyond the remembrance of that mythical personage, "the oldest inhabitant."

The present work is substantially the same as the "Atheths wakya deepenya" published by my late lamented father A. Mendis Mudaliyar. A considerable amount of new matter has been added in the present work besides an English translation and a few notes intended to explain obsolete terms, allusions to antiquated customs &c. which are not known to the generality of readers.

Our readers will find that several proverbs &c. have been left untranslated. This has been the case with those which lose their point and beauty when translated into English and thus appear either utterly tame or entirely meaningless to one who is unable to read the Sinhalese original. Additions made in the proofs have for the most part no English translation subjoined.

It is hardly necessary to tell our readers that many Sinhalese proverbs owe their beauty to alliterations, puns, &c. which cannot be exhibited in an English translation. As instances we may give the following—

කොරේ පිටට මරේ.
උකුල් නැවේ කොරේට බුකුල් ඇත්තාට සුවවේද ?
උපාදත්තෙනා අපාතෙනායත්.

An observing reader will see that most of the proverbs mentioned in the following pages have their equivalents in other languages. For instance අලුත් ඉලපතක් හොඳට පිසදමනවාලු, exactly corresponds to the English proverb, A new broom sweeps well; ලූලා නැති වලට කණයා පණ්ඩිතයා is similar to the Tamil, *விராலில்லா குழத்துக் குறவை அதிகாரம்*; and තොතා දිය සිඳෙද නකල් බලාඋත්තා වගෙයි is equivalent to the Latin, "Rusticus expectat dum defluat amnis."

The compiler cannot be too sensible of the many defects and imperfections of the present work. He however hopes that an indulgent public will over-look them and extend to him the same degree of encouragement and patronage as was accorded to his father.

# අතීත වාක්‍ය දීපනිය.

## ATHETHA WĀKYA DEEPENYA.

අකලට පලගත් ගෙඩිය වගෙයි.

Like an unseasonable fruit.

අඟුර ගලගා සුදුකරන්නැයි ?

Can friction against a stone ever make a charcoal white ?

අගේ ඉඳ ගන කණ කනවාලු.

To feed on the ear whilst sitting on the horn.

අටවම්බටු නවහුංගං දුන්නා වගෙයි.

Eight brinjals but nine taxes.

[A certain man took eight brinjals for sale to a village where there were nine headmen. He returned home empty handed and in utter disappointment as he had to give eight of the headmen a brinjal a piece and to the ninth his basket in order to obtain permission to enter the village.]

අටුව කඩා පුටුව හදනවා වගෙයි.

To pull down the loft and make a chair out of the materials.

අඩියත් අඩියවත් ගමටලු.

Even a step in advance leads to the village.

අඩු කලේ දිය සෙලවෙයි.

The water in a half-filled pot shakes.

අඬුව තිබෙද්දී අත පුලුස්සා ගත්තා වගෙයි.

To get the hand burnt whilst having the pincers.

අතංමතං දෙඩවා උනම් පතම් අත ගත්තා වගෙයි.

Like getting one's defects exposed by speaking nonsense.

අනුන්ට කළදේ තමන්ට පලදේ.

What you do to others will bear fruit in you.

අනුන්ගෙ පොරවටවඩා තමන්ගේ විදුර, මහ හොඳලු.

Ones own gum is better than another's axe.

අනුන්ගෙ මඟුල්දාට තමන්ගෙ ආදරේ පෙන්වන්නා වගෙයි.

To show one's hospitality at the wedding of another.

අනුන්ගේ හිසරදෙත් හොඳලු.

Even the head-ache of another is preferable.

අන්ධයෙකුට දිකිරිවල සුදු කීවා වගෙයි. (ජාත්‍යන්ධයෙක් දිකිරිවල හැටි ඇසුවාම සුදුයයි කීවා, සුදු කොයි හැටිදැයි ඇසුවාම හක්ගෙඩිය වගෙයි කීවා, හක්ගෙඩිය කොයිහැටිදැයි ඇසුවාම පොල්වගෙයි කීවා, පොල්වල හැටි ඇසුවාම කොකාවගෙයි කීවා, කොකාගෙ හැටි ඇසුවාම අත හැඩකර පෙන්නුවා, එවිට අන්ධයා අතගා බලා අනේ! දිකිරිවල හැටිත් හරියටම අතවාගෙමයි කීවාලු)

Like the description of curd given to a blind man.

[A person being asked what curd was like by a man who was born blind, said it was white, on being asked what white was like, he said it was like a conch-shell; when asked again by the blind man what a conch-shell was like, he said it was like the kernal of a cocoanut. "Whatis a cocoa-nut like"? asked the blindman "It is like a crane" was the reply. "What is a crane like ?" was the next question. The man bent his hand into the shape of a crane and asked the blindman to feel it. The blindman felt the hand and said "Oh after all curd is exactly like the hand."]

අන්ධයන් හතරදෙනා ඇතාගෙ ලක්ෂණ කීවා වගෙයි. (කකුල් ඇල්ලූ අය වංගෙඩිය වගෙයි කීවාලු, හොඬේ ඇල්ලූ අය පැනොල්කද වාගෙයි

කිවාලු, කණ අල්ලපු අය වට්ටිය වගෙයි කිවාලු,
වල්ගෙ අල්ලපු අය බුවල්ල වගෙයි කිවාලු.]

Like the descriptions given by four blindmen of the elephant.

He who touched the leg said the elephant was like a rice-pounder ; he who touched the trunk, said the elephant was like the stem of a Pappaya tree ; he who touched the ear said the elephant was like a Bamboo-tray while the last who touched the tail said the elephant was like a dried cocoanut flower.

අන්ධයාට මොන පහන් එළියද ?

What is the use of lamp light to a blindman.

අත දීලා දණනියවන්නා වගෙයි.

Like supplicating a man after placing one's self in his power.

අතුර මැදදී අත්වැල කැඩුනා වගෙයි.

Like the breaking of the supporting rope while one has gone half-way along the couplinge [අතුර is the rope connecting cocoa-nut trees from which toddy is drawn. අත්කොළේ is a rope parallel to the අතුර, meant for the support of the toddy-drawer.]

අතේ හකුරු ඇත්නම් කොයි ලිඳෙන් දිය ඇත්ලු.

If you have juggery in hand water may be had from any well.

අප්පා නැති එකා අප්පා එක්ව බුදින්න කන්ට අඬාවා ක්‍රමනි.

Like a fatherless child crying to his father to come and eat with him.

ඉඹුතුබත් දීම අත ඇල්වීමෙන් දැනෙයි.

The desire to show one's hospitality could be made out by the way in which the host catches hold of the hand of the intended guest *

* See note 1

අමුවට ඉස්සරවෙලා තණවලු පූදිනවාලූ.

Tares yield a harvest before amu. (*Paspalum*)

(Tares which are of spontaneous growth come to perfection sooner than amu on which much labour is bestowed.)

අමුතුගම් ගන්ට ගොස් තිබුන ගමත් නැතිවුනා වගෙයි.

To lose the village one has by trying to get others.

අමුකල කෙනෙක් අමුගෙණියත්, වීකල කෙනෙක් වී ගෙණියත්.

He who sows amu will reap amu, he who sows paddy will reap paddy.

[Whatsoever a man sows that shall he reap]

අම්බලම කැඩුනත් ගව්ව කුඩානොවෙයි

The destruction of the ambalama will not shorten the gauwa. (*four miles*)

[Ambalama is a sort of Caravanserai.]

අරින්ට ඉන්න දීගෙ සෙවනැල්ලත් ඇදලූ.

Even the shadow of the wife to be divorced is deformed.

අරූප ස්ත්‍රියගෙ පතිව්‍රතාව වගෙයි.

Like the chastity of an ugly woman.

අලව වැඩිලූ කොස්, ඊටත් වැඩිලූ හිසරදේ.

Jack is more common than yams and headache more common than Jack.

අල බස්නාකල් උන්නැකිලූ, තැම්බෙනාකල් ඉන්ට බැරිලූ.

One has patience till yams grow but not till they are cooked.

අලියා මඟ අඩිපාර සොයා යන්ට කන්නාඩිය ඕන නැයි.

Spectacles are not necessary to make out the footprints of an elephant.

අලි වීකුණ බැරිවෙලා, තම්පලා වීකුණ හරියයිද ?

Is it of any advantage to take to selling herbs after one has failed in the trade of elephants ?

අලි මදිවට හරක්.

Bullocks too in addition to elephants.

අලුකෙහෙල් නැත්නම් කළුකෙහෙල්වත් ගන්ටලු.

If ash-plantain is not to be had, even black-plantain would do.

අලුත් ඉලපතේ හොඳට පිහදමෙනවාලු.

A new eacle broom sweeps well.

අලුත් පිටට ගෝණිය කැඳලුවා වගෙයි.

Like starching new gunny bags.

අල ලොකුවුව බැස්සොත් ඉන්දුළිකාවත් උගෙ අඹුටත් හොඳලු.

[f yams grow big, it will be to the advantage of the planter and his wife.

අව්වෙන් දැව්ව මිනිහා ගින්නට පෙරළුවාක්මෙනි.

[o push into the fire the man that has been scorched by the sun.

Eng— Jump from the frying pan into the fire.)

අහසවත් වැදූ මවුත් හොඳක් නැත්ලු.

ine's own mother and the sky are never well spoken of.

අඳුනන බල්ලෝ බුරන්නා වගෙයි,

ike the barking of familiar dogs.

පල ගෙවල් දෙකේ මගුල් ගන්න දව, ළඟ ගෙදර බල්ලා බඩගින්නේලු

Vhen a wedding takes place in two adjoining houses the dog of the neighbouring house is left to starve

කරුවට මතෙ අප්පුත් වෙදරාළලු.

n a sudden emergency even Matha Appu would make a doctor.

[atha Appu is a term of contempt for one who has not even a smattering of medicine.]

අසීරුවට හිඟුරු වැලෙත් එල්ලෙනවාලු.

In cases of necessity people cling on to the Hinguru creeper.

[Hinguru is a thorny creeper.]

අශ්වයාට අඟ නොලැබුනා වගෙයි.

Like the horse not getting horns.

ආඬි කැඳ උයිව්වා වගෙයි- ආඬි හද්දෙනෙක් එක ඉඩම්
ක තාවාතැන්ගෙන හව්ලේ කැඳ ඉව් මට කථා
කරගනා හැලියේ දියවක්කර ලිපතබා, එකිනෙ
කාගෙ ඔලගුවලට අත පොවා හාල්දමින්නාය
මෙන් පෙණීමට අත පෙව්වා මිස එක්කෙනෙනාය
වින් හාල් දැම්මේ නැතැ-හැලිය බාලා බැල්වාම
තිබුනේ උණුදිය පමණයි.

As the Andiyas cooked cunjee.

[Seven andiyas who happened to be in the sam lodging agreed to cook a pot of cunjee for thei common use. Each one promised to contribut a handful of rice. A pot of water was accord ingly placed over the fire and each of th Andiyas thinking that the others would pu in their quota of rice went near the pot an pretended to put in his handful. At las however when the contents of the pot wer poured out it was found to contain nothin but water.]

ආඬි ගොල්ල එක ඉනමේ, කොක්කනම් පයිස වෙනවෙ
නමේ.

Though Andiyas belong to the same caste, the bags are kept separate *

ආඳමාළු ඉරවුවෙන් කන්නා වගෙයි.

Liko eating eel fish with an eaclo.

[To get a task which is repugnant to us, performe by others.]

---

* See Note 2.

ඇඹෑරියා රවටා ගමරාල කැත්ත හැදෙව්වා වගෙයි.

Like the rustic who got his knife made by imposing on the blacksmith.

A rustic who went to a blacksmith to get a knife made gave the latter only the iron keeping back the steel, thinking by that means to deceive him.

---

ඉක්මන් වැඩගත්තයි කියා බඩාලාට පියා ගැහුවා වගෙයි-එක ගෑණියක් ඇගෙ දුවට බත්කවන දිනට ඕනැයි කියා සැදීමට භාරදුන් කරාබු දෙක ලැබුනේ නැහැ-ඒ දූ දීගෙගොස් දුවක් වදා බත් කවන දිනට දෙන්ට ඕනැයයි දෙවනු ඇවිත් බලකර දෙනුවාම, ඔපමණ ඉක්මන් වැඩ තෝ භාර ගත්තේ මන්ද කියා බඩාලාට ඔහුගේ පියා ගැහුවාලු.

Like the Silversmith's father beating his son for undertaking an urgent work.

[A certain woman ordered a pair of earings for her little daughter to be used on the day of her weaning. The silversmith having failed to give it on the day appointed, she made him promise that he would give it on the day that her grand-daughter would be weaned. The silversmith's father on hearing of the promise his son had made, gave him a thrashing ]

ඉක්මනට කොරහෙත් අතලන්ට බැරිලු.

A person cannot put his hand in a hurry even into a koreha.

[Koreha is a large pot.]

ඉතා චිදෙවන්නේ කානාවැන්දුම් වෙන්ටලු,

Excessive fondness for a spouse betokens approaching widowhood.

ඉස අතගා ඇස උදුප්පන්නා වගෙයි.

To pat one on the head and pull out his eye.

ඉසට උඩින් කටක් ඇද්ද?
Is there a mouth above the head ?
ඉසරදේට කොට්ටේ මාරුකලා වගෙයි.
Like changing pillows to get relief from head-ache
ඉස අල්ලන්ටනම් පළමුවෙන් කකුල අල්ලන්වලු.
If you want to touch the head, first touch the foot.
ඉස්සරවෙලා ආ කණට වඩා, පස්සෙ ආ අඟ දික්වුනා වගෙයි.
The horn that is of more recent growth than the ear becomes longer than the latter.
ඉස්සාගෙ ඉසේ කුණු තිබාගෙන මම සුද්දයි කිවාලු.
Like the sprawn making pretensions to cleanliness despite the filth he has on his head·
ඉඟිකලාම නොදන්නොත්තාට කොලමෝලෙන් ඇනත් නත් නොදනෙලු.
A blow with a pestle will make no impression on one to whom a wink is of no effect.
ඉහිරෙන දෙය ලෙව [illegible]ෑවත් ලාබලු.
It is a gain even to lick up anything that is running to waste,
ඉබි කබලත් බෙහෙතට ඕනැවෙනවාලු.
Even tortoise-shell is used for medicine.
ඉබ්බාගෙන් පස්සෙම්න්තු [illegible]ල්ලන්නා වගෙයි.
Like asking a tortoise for lo:k-stitchings.
ඉබ්බාව කා[illegible]රණනාගන [illegible]නාල බැරිවුනා කථාව වගෙයි-
දින ගිණ [illegible]ම්ත් ඇවිදි[illegible] ඉබ්බෙකුට කරුණාවන් [illegible] [illegible] සම්බව [illegible] උඩ [illegible] දින ඇ[illegible] අපි උඩ [illegible] [illegible] [illegible] බැහැගන [illegible] [illegible] කොස්කු [illegible] [illegible] රතිබා [illegible] [illegible] [illegible] ක් [illegible] ; නොයකුනේ [illegible] ඉබ්බා කුමත් [illegible]

ගෙනයන්නේදැයි ඇසීය-එවිට ඉබ්බා ඊට උත්තරදෙන පිණිස කට ඇරියාම බිම වැටුනාලු.

Like the tortoise who failed to govern his tongue·
[Two friendly cranes once met a tortoise who was in search of a pool of water. They promised to take him to a place where there was water, and asked the tortoise to hold by his mouth a stick either end of which each of them would take and fly off with him. The tortoise was strictly enjoined not to open his mouth ; and when he was being carried in this manner, on the way a cunning fox called out to the cranes and asked them why they were carrying the tortoise. The foolish tortoise on hearing this opened his mouth to give a reply, when he immediately fell down.]

ඉබ්බා සිංහයාව පරාජය කලාලු.

The tortoise is said to have vanquished the lion.

ඉලිප්පෙන ලිය ගේගත්තා වගෙයි.

ඉබ්බා දියේ දමන්වෙයි නිකල ඉලව්වෙයි කියා කෑගැසුවාලු.

Like the tortoise who cried out "Oh ! what a mishap, on being thrown into water.

ඉබ්බෝ කවද ගස්ගියෝ ?

When did tortoises climb up trees ?

ඉඳිකටුවක් රත්රං වුනාලු මොකද ?

What advantage is there even if a needle be changed into gold ?

ඉඳිකටු මුදනේ තපස් රකිනවා වගෙයි.

Like leading an ascetic's life on the point of a needle.

ඉඳ ඇඬුවන්ට ඉඳ ඇඬිමත්, සිට ඇඬුවන්ට සිට ඇඬිමත් තිසිලු.

For those who cried standing, we should cry standing, and for those who cried sitting we should cry sitting.

ඉත්තෑවිගෙ ගුලේ කබල්ලෑවා වැදී මුත්තාපා කිව ත් යන්නේ නැත කීවාලු.

The ant-eater who forcibly got possession of the porcupine's hole, swore that he would not leave it on any account.

ඉවසිල්ලෙන් සැනසිල්ල ලැබේලු.

Patience begets comfort.

ඉවසන එනා රැපු සූදයට ජයකොඩිය.

A man of patience is a banner of victory in the battle-field.

ඉරට්ට මෝඩයයි නම්ලත් එකා වගෙයි-එක් මෝඩ යෙක් නැගිතිය අගුල ගිලෙබසිත්ට යද්දී, බර අඩුකරණ අදහසින් තමන්ගේ කද කරතිබාගත් විට ඉරට්ට මෝඩයයි ඔහුට එහි උන් කෙනෙක් කීවාලු.

Like the man who was called double fool.

[A certain fool when his boat was in danger of sinking took the pingo he had in the boat on his shoulders with the object of lightening the boat ]

---

උකුල් ඇටේ නොරේට බූකුල් ඇන්නාව, සුවවේද?

Boxing will not set to right a thigh-bone out of joint·

උගුඩුවා ඇටකෙසෙල් කෑවා දෙවනුව දැනෙන්නේ.

The wild cat who eats jungle plantain will feel the effects of it afterwards.

උගුඩුවා ඇටකෙසෙල් කෑවාවගෙයි- උගුඩුවෙක් කි නුවනට ඇටකෙසෙල්කා තද අඩස්සියක් හැදී වේදනාවෙන් ඉන්දදී මේ වේදනාව සුවවුනිනම් ජ් තාවත්නැ දක්වා ඇටකෙසෙල් නොකම් කි යා සනත්කලෙස ඉඳ සුවවූපාසින් පසු, ඇත කා ත්දක ඇටකෙසෙල්නැගක් ඉදී තිබෙන ඉ

ඍණ දැක, එදා ගොස් අතගා ඇවිත්, පසුවදා ගොස් එක ගෙඩියක් කා, ඉන් පසුවදා ගොස් 'මේ කන්දේ කෙසෙල්ගෙඩි අගුණ නැත' කියා බඩ ගන්නාතෙක් කා ඇවිත් ඇල්ලුම් අඩස්සිය සුව නොවී මැරුණාලු.

As the wild-cat ate jungle plantains.

A wild-cat getting a severe disorder in the stomach by eating wild plantains swore he would never eat them again if he were to get well. Soon after his cure, seeing a bunch of wild plantains on a neighbouring hill he went up to it and handled it. The next day he went to the place and ate one; on the third day he ate to his heart's content, observing that the plantains of that hill were not unwholesome. This time however he got a more severe complaint in thestomach than before, which proved fatal.

උගුරට හොරා බෙහෙත් කන්නාවගෙයි.

Like attempting to swallow down medicines without the knowledge of the throat.

උගුලේ අසුවුනු නරියා කට ඇරගෙන පනහන්ට එද්දීත් මේක සිනාවෙයි කීවාලු.

The opening of the mouth in his death agony by the fox who was caught in a trap was said to be a smile.

උඩපැන්නොත් බිම වැටේලු.

If you jump up, you will also fall down.

උඩබලා කෙළගැසුවාම තමන්ගේ මූණේත් වැටෙනවාලු.

If you look up and spit, the spittle will fall on your face.

උදැල්ලේ පස් බඩතුරටයි කීවා.

The earth from the hoe will get into the folds of the cloth about the waist of the person who digs.

උඩින් හකුරු යටින් කතුරු.

Juggery on the surface, scissors underneath.

උනහපුළුවාගෙ දරුවා ඌට මැණික ලු.

The young of the loris is gem to her.

උනහපුළුවාගෙ ඇසින් කඳුළුගාන්ට බැරුවා වගෙයි.

Tears will not come from the eye of a loris.

උන වගේ උන වගෙන්ම ගිනිගන්නවාලු.

The fire in a bamboo jungle is produced in the jungle itself. †

උණු නිසා බොන්ටත් බැහැ, කැඳ නිසා අහකලන්ටත් බැහැ.

As it is hot it cannot be drunk, but being gruel it cannot be thrown away.

උත්තමයින්ගේ ගුණ උත්තමයෝ දනිත්.

Great men will know the good qualities of their equals.

උදේ සිට දිය ඇද්ද මිනිහත්, සවස කලේ බින් ; මිනිහත් සමසමවුනා වගෙයි.

The man who drew water from morning till evening & the man who came towards evening and broke the pot, met with the same treatment.

උඳුපියලි කොළේ වැස්ස නියඟ දෙකටම එකාකාරයි.

The Undupialy leaf (*Hedysarum*) is the same in wet weather as in the dry.

උපත් ලෙඩ ගතිය බලි ඇරියත් සුවකරන්ට බැරිලු.

Natural deformity cannot be cured even by propitiating the planets.

උපාදාය [illegible] අපා නොයත්.

උපාසකනමට නොබිර රා බීම.

It does not become an upasakaya (A Budhist devotee) to drink toddy.

† Fires are often caused in bamboo jungles by the friction of the bamboo trees against each other

උරුලෑවා බළලා නොවෙන්නාක්මෙනි.
The civat-cat will never become a cat.

උපදින්ට ඉස්සර පෙකණිවැල කපනැකැයි?
Could the navel-string be cut before birth?

ඌ කළ දේ ඌ ගෙණියයි, තෝ කළ දේ තෝ ගෙණියයි.
You will reap the fruit of your doings, and he of his.

[This is supposed to have been said by a Budhist Priest who on attempting to cross a dam was pushed off by one man, but was helped over it by another]

ඌරන්ට මොනා අච්චාරුද?
What pickles for pigs.

ඌරගෙ හොස්සේ රත්රන් බැන්දක්මෙනි.
Like covering a pig's snout with gold.

ඌරෙකුට ඌරෙක් හාරදෙනවා නොවේලු.
One pig will not dig for another.

ඌරගෙ මස් ඌගෙ ඇගේ තිබා කපන්නා වගෙයි.
Like chopping the flesh of a pig on its own back.

---

එක මිනිහෙක් කුරහන් කන්ට බැරුව කෑම ඇති රටක් සොයා ගියාම, ඒ පළාතේ අයවල් කුරහන් තලප කාලා ඇඟිලි ගෙවිලාලු.

A certain man being unable to eat Kurahan went in search of a country where he thought better food could be had. On going there however he found that the fingers of the people of that country had wasted by their constantly handling Kurahan porridge.

එක මෝඩයෙක් අමුඩේ ගැනුවා වගෙයි-හොරු අල්ලන්ට ගොස් කඩුල්ල උඩ ඉඳ එය අසුකර පිටපටගසාගත, හොරු දැක දුවන්ට වකගම්කලු

නමුත්, මේ අවසිරේ නිසා දුවන්ට බැරිවී මා අ
තඅරෑ කියකියා කෑ ගැසුවාලු.

Like the way in which a certain fool tied his truss

[A certain person who had gone out to catch thieves sat on a stile and unconsciously tied his truss so as to get entangled in it. Being however unable to get away when he attempted to run after thieves, thinking that he was held down by some one he cried out "Let me go let me go.' ]

එක මිනිහෙක් සූකිරිවල රස කීවා වගෙයි-සූකිරි
නොදැ රසය කීවා, උඹ කෑව දැයි ඇසුවාම, නෑ
න අපේ අය්යා කීවාය, අය්යා කෑව දැයි ඇසුවා
ම, නෑන කොළඹ ඇත්තෝ කනවා උන්දෑ දුටු
වයි කීවාලු.

Like a certain man's description of the taste of sugar-candy.

A certain man who said that sugar-candy was sweet, being asked if he had ever tasted it, said "no, my brother told me so." On being further questioned as to whether his brother had tasted it, he said "No, my brother saw Colombo people eat it"

එක රටකට ගියාම ආනන්ට බැරිඑ-නම රටකට ගි
යාම කාරන්ඩ බැරිලු.

එක මිනිහෙක් පන්සිල් ගන්නාවගෙයි-ගෙදර ගැනි
පන්සිල් අරගා ඇවිත් අනේ! ඔසී, හාමුදුරුවන්
පන්සිල් ගන්ට තරකද නෑ පුරුෂයාගෙන් ඇ
සූවාම, අනේ බාත් මට ඒවැගේ දැනෙත්තේ නෑ
න කියා උත්තර දුන්විට ඒනැති දැනීමක් කුමට
ද හාමුදුරු[illegible] කියනා වචනේ කියනවා පමණ
ක කියා ස්ත්‍රී උත්තර දුන්නාම, මො පුරුෂයා
පන්සලට පිටත්ව ගියා, එවිට [illegible]! මේ බැහැර
න්දැයි උන්නාන්සේ ඇසූවාම මෙම අසත් එලෙස

ම කීවාඑ-හොත; මේ පිස්සුවක්ද කීවාමත් එවෙල
සම කීවාඑ-යහමුා කියා උන්නාන්සේ කීවාමත්,
එසේම කියනවා කොට පන්සලේ කොල්ලෝ ඇවි
ත් ගුම්බැට දීපිඑ-එනන්න් සමිනත් පණාලවා
ගණ ගෙදර ඇවිත් "නෝ·බාත් යෝද් යි! උඹ
දෙපෝසට පන්සිල් අරන් සනීපෙන් ඉන්න හාමු
ත්, එක දවසේ පන්සිල් අරන් මගේ ඇඟ ඇව
පොඩිවී උණගන්නයි කීව ලු.

As a certain person received Pansil *

A certain woman on her return from the temple after receiving Pansil, asked the husband why he too did not receive Pansil. "I do not know how to do it," replied the husband. "What you have to do," said the wife, "when you go to the temple is to repeat after the priest whatever he tells you" The husband accordingly went to the temple. The priest on seeing the man, asked him "Hallo man, where are you going ? The man too repeated the same words, "Are you mad?" said the priest. "Are you mad?" rejoined the man. "The priest who had waxed very wrath now ordered his attendants to give the man a thrashing This order too was repeated by the man in the very words of the priest. The man however was given a sound thrashing by the priests' attendants. On going home he told his wife, that he was surprised she looked so healthy after receiving Pansil ones a fort-night whereas he had caught a fever by receivig it only once.

එක ගෑනියක් මනුබලා ..ළිඳුවා වගස්- ගැළමලද "බ
ඩෙත් එංකෙත අම්මෙට්" කිය කියා හැඬුවාලු
තවමත් ඒ දරුවා උපන්නෙත් නැතිලු.

As a woman cried in anticipation.

A certain woman on the day of her husband's

---

* See note 3,

death, in order to work on the feelings of the bystanders, cried out that she had a child in her womb. This child however was never born.

ඓක සිත් නම් තම්බාකොළු පලාවත් වෙනස්වත් නම් යමු කාවන් බලාගෙන් කියා ගැනීයක් කිවාලු.

If we are of one mind, let us live even on herbs, if not let us separate.

එක පන්සලේ ඉන්න මහනුන්නාන්සේලත් කුඩම්මි ගෙරවාගන්නවාලු.

Even the Budhist priests who live in the same temple come to logger-heads.

එක්ක කනා බොටුව කපනවා වගෙයි.

Like cutting one's throat whilst eating out of the same dish·

එක්ක කනත් බොක්ක වෙනලු.

The dish which is eaten out of is the same, but the stomachs of the eaters are different.

එක් ඇහැ කටු ඇන්නාම අනිත් ඇහෙනුත් කඳුළු එනවාලු.

When one eye is pricked, tears will come out of the other too.

එලිපත්තේ ඉන්න බළලාවගෙයි.

Like the cat on the door-step.

---

ඒ කැලෙන් මේ කැලේට පැන්නාම මුවාගේ තිත් මැකෙන් ?

Will the spots of a deer vanish out by his jumping from one jungle to another ?

---

ඔන්චිල්ලා ඉබගීයොත් මොබත් එලු.

If the swing goes forward, it will come backward too.

ඔරුවට ලොකු කොල්ලෑව වගෙයි.

Like the out-rigger that is bigger than the boat.

ඔරුව පෙරළුනාම ඒ පිටට වඩා මේ පිට හොඳෙයි කිවාළු.

Like saying that the wrong side of the boat is better than the other; when the boat is upset.

---

ගැහලා බැන්දත්, බැඳලා ඇන්නත් දෙකම එකයි.

It makes no difference whether you beat a person first and then tie him up, or tie up a person first and then beat him.

ඇතාට විදලත් අත උස්වුනායි කිවා වාගෙයි.

Like ascribing the failure of an attempt to hit an elephant to not being able to take proper aim.

ඇතා ගිල්ල දිවුල්ගෙඩිය මෙන්.

Like the wood-apple that was swallowed by the Elephant. *

ඇතා වැරුණත් කොරහේ නාවන්ට බැරිලු.

Though the Elephant gets lean, it cannot be bathed in a pan.

ඇතිවෙන ගහ දෙපෙත්තේදී දැනෙයි.

The tree which will grow could be known when two leaves spring out.

ඇත්තු දලදෙනකොට මැද තිබෙන තෝර ගැවෙනවාලු.

When Elephants wrestle with their trunks, the cassia-plants that are between them are injured.

ඇතුන් යන පාරේ වටුවොත් යනවාලු.

Snipes also go on the same path as Elephants.

ඇත්ත කියන්නාට තැබෑරුමත් ඉඩනැත්ලු.

The truthful man has no room even in the tavern.

* See note 4

ඇත්ත කියා පැත්තක් කෑවත් හොඳලු.

No matter even if you eat up a half of one's body after telling him the truth.

ඇත්තෙත් දෙන්නායි, මැද නින්දත් ඕනෑලු.

There are but two in the bed, each of them wants to sleep in the middle.

ඇපවෙනවාට වඩා කැපවෙනවා හොඳලු.

It is better to be one's victim than his security.

ඇහැළපොළගෙ මුල වනසමැයි සිතා ඇහැළමුල් උදුරුවා වගෙයි.

Like rooting out Ehéla *(Indian laburanam)* with the object of destroying the race of Ehélapola. †

ඇහැළ පෙරහැරට බෙරත් ඇද්ද?

Are tom-toms used at an Ehéla Perahera ?

[An Ehéla Perahera *(A Budhist festival)* is never performed without the beating of tom toms which are absolutely necessary for it.]

ඇඟිල්ලෙ තරමට ඉදිමෙන්ට ඕනෑලු.

The swelling of the finger must be proportioned to its size.

ඇඬුකොටඑ කිරි එරෙන්නෙ.

The mother gets milk when the child cries for it.

ඇල්ලට බැහැලා පාමත් බලන්නා වගෙයි.

Like looking about for footmarks after once getting into a ‡ stream with the object of crossing it.

ඇල්වතුරෙන් පුළුස්සන්නා වගෙයි.

Like burning with cold water.

ඇවිලෙන ගින්නට පිදුරු දමන්නා වගෙයි.

Like consigning straw to a raging fire.

---

† See note 5

‡ The word ඇල්ල translated by stream here generally means "rapids."

ඇවිද්ද පය දහස්වටී, ගෙයි තිබූපය බලුතෑපාවටී.

The foot of one who has travelled about, is worth thousands, but the foot of one who has kept at home is not worth a kick.

ඈත තිබෙන මොනර මසට වඩා, ළඟ තිබෙන කපුටු මස හොඳළු.

Better is crow-flesh that is at hand, than peacock-flesh that is far off.

---

කකුළුවා දියරත්වෙනකල් කරණ සෙල්ලමවගෙයි.

The crab plays about in the water (in which he is being boiled) till it gets hot.

කකුළුවා පැත්තෙන් පැත්තට යමින්, පැටවුන්ට කෙලින් එන්ට කියනවාලු.

The parent crab who walks crooked, tells its young ones to walk straight.

කටුනාලේ පිපුන මලවගෙයි.

Like a flower blown amongst brambles.

කටුස්සාට රත්රන් පැලඳුවා වගෙයි– රජ්ජුරුවන් දුටුවාම උඟ ගහෙන් බැහැගන ඇවිත්, නමස්කාර කරණවා දැක කණේ කඩුක්කනමක් දම්මෙව්ද සිට රජ්ජුරුවන් දැක ඉහලට නැගලු.

Like adorning the chamelion with a gold ornament.

A king who had observed that a chamelion was in the habit of getting down a tree and saluting him whenever he was seen, ordered a gold earing to be put on the chamelion's ear. On the following day however, the chamelion inst ead of behaving towards the king as before, on seeing him went up the tree and took no notice of him.

කඩන්ට බැරිමල බුදුන්නේ නමට පූජාවෙච්චාවෙයි කිව්වාළු.

Like saying of the flower which cannot be plucked "Let it be offered to Buddha."

කණකොකාගෙ සුදපෙනෙන්නේ ඉගිලුනාමලු.

The white of a crane appears only when it flies. [The upper part of the body of a Kaneköka (*A species of crane)* is brown, and the lower is white.]

කණකැස්බා වියසිදුරෙන් අහස බලන්නා වගෙයි.

කණමීදෙනගෙ තෙල් ඇගෙ ඇස්රෝගෙටවත් මදිලු.

The ghee obtained from the milk of a blind she-buffalo is not enough even for a disorder in her eye.

කපන්ට බැරි අත සිඹින්නා වගෙයි.

To kiss the hand that cannot be cut off.

කපුටාට වණේ කැක්කුම මොටද ?

The pain of an animal's wound is of no consequence to the crow.

කපුරු දැවිතැන අලුනැතිලු.

Where camphor is burnt no ashes will be left.

කම්මැලියාට දිවැස්ලු.

The sluggard can prophesy.

කම්මැලිකම පාපයේ මුල් පියාලු.

Laziness is the father of sin.

කම්මලේ ඇතිවෙච්චි බල්ලා ගෙරෝවත් හයනැත්ලු.

The dog that has been brought up in a blacksmith's shop is not afraid even of thunder.

කරවල වෙළඳාමේ ඇවිත් සුදු සඳුන්වල ගණන් කුමටද ?

What has the seller of dry-fish to do with the price of sandelwood ?

කරුමෙන් උපන් දරුවාට වෙදකරණ්ණේ මොකද ?

What is the use of doctoring a child born to misery.

කලදුටුදා වල ඉහින්නා වගෙයි.

Like emptying the pit just at the nick of time.

කල වෙළඳාමෙන් අතේ තිබුණ එකත් නැතුව ගියාලු.

To lose the money one has in his possession by embarking in a new trade

කළු කළ දේ පල පලදේ.

You will reap the fruit of your doings.

කළුවා මාරපනේ ගියා වාගෙයි-නිලමේ කෙනෙකුගේ වැඩකාරයා වන මොහුට කථාකර, කළුවේ තෝ මාරපනේ ගොසින් එන්ට ඕනෑයයි කියා නිලමේ ගෙට ගොස් ලියමන අරන්එන්ට ප්‍රථම ඔහු පිටත්ව මාරපනට ගියා ලු-දෙවනු උඟ ආවාම ඇයි අඩේ ඔහොම ගියේ! කියා ඇසුවිට ගොසින්එන්ට කී ලෙස මම ගොස් ආවායයි කිවාලු.

Like Kaluwa's trip to Márapana.

A certain Nilame told his servant Kaluwa that he was to go to the village of Márapana, intending to send a letter by him. But before the Nilame could fetch the letter Kaluwa started off. Being asked on his return why he went away in that manner, Kaluwa replied that he only did what he was told. He was asked to go Márapana, and he did so.

කළුහාමිගෙ අප්පොච්චි අශ්විසා දෑවැද්දට දුන්නාවාගෙයි-එක් පිටිසර ගමක මව්පිය දෙදෙනෙකුට ඇතුව සිටි කළුහාමි නමැති දුව මැරී ගිය දිනකට පසු, කළුහාමිගෙ පියා ගෙදර නැතිවිටක ඉතා කෙට්ටු හිඟන්නෙක් එම ගෙදරට ආවාම, කළුහාමිගෙ මැණියෝ ඔහු දැක උඹ මේ තරම් කෙට්ටුවෙලා මොකදැයි ඇසූ විට, මම එලොව ගොස් මෙලොව ආවයි කිවාලු-හිඟන්නා එලෙස උත්තර දුන්නේ ඔහු තදබල රෝගාතුරයෙක්ව සිටි නිසයි-එවිට ඒ මෝඩ මව් අපේ කළුහාමි දුටුවාදැයි ඇසුවාම, එලොවදී ඒ කළුහාමිව කසාද බැන්දේ මමයයි උත්තර දුන්නාලු, එවිට අනේ මගෙ බෑනෝ! එලොවදී මගෙ දූටත් උඹටත් පැලදී මට මේවා අරන් පලයන් කියා ගෙදර තුබුන රන්රිදී මුතුමැණික් පටපිළි යනාදි නොයෙක්දේ

ඔහුට හාරදුන්නාළු-එතනින් ඔහු පිටත්වගො
ස් ටිකේ වේලාවකට පසු කළුහාමිගෙ පියා ගෙදර ආ
විට එලොව ආරංචි සහ දූවැද් දී ඇරියහැටිත්
ඇ කිවාලු-එවිට මේ මෝඩකම කෙළේ මන්දසි
බැනා කිපී ඒ කියන්නා අල්ලන අදහසින් අශ්ව
යාපිට නැගී ගිය දෙසට එලවා යනවා ඒ කිය
න්නා ඇතදි දුක ගඟකට ගොඩනැගුනාම මෙ
ම අය ඒ දුක අශ්වයා එම ගඟේ බැඳ ගඟට
ගොඩනැගී එනබව පලමු ගඟට ගිය කියන්නා
දුක, ඔහු අන්නක් දිගේ ගොස් බිමට පැන අශ්
වයා පිටනැගී පන්නා දුවනවා දුක, කිසිවක් නැ
රත්ව බැරි මේ ගමරාළ ගඟේ ඉඳ බැගෙපු කියා
හඬනසා, ඇඳුම් ආයිත්තම් අම්මා දුන්නාය-අශ්
වයා තොප මම දූවැද්ද දුන්නාය කියා කළුහාමි
ට පිය පිය කිවාලු.

As Kaluhamy's father gave away his horse in dowry.

Once upon a time there lived in a certain village a Gameiāla and his wife, whose only child was a daughter by name Kaluhamy. It happened that this daughter died a premature death to the great sorrow of her parents. Soon after her death a lean beggar came to the house in the absence of the Gamerâla. The sorrowing mother of Kaluhamy pitying the wretched condition of the beggar asked him how he had got so lean. "I have just returned from the other world," replied the beggar, meaning of course that he had only recently recovered from a dangerous illness. The foolish mother taking the beggar's reply literally asked him if he had seen Kaluhamy there. The beggar finding out how simple the woman was determined to take advantage of the occasion. "It is I who married her in the other world," said he in reply to her question, Kaluhamy's

mother on hearing this affectionately embraced the beggar as her son-in-law, and gave him all the jewels and silk that were in the house to be taken to the other world for the use of Kaluhamy & her husband A little while after the beggar had gone away the Gamarála returned home The wife then related to him what had happened during his absence. The Gamarála got highly incensed at what he heard. After severly rebuking the wife for her folly, he rode off in the same direction that the beggar had gone with the object of capturing him The beggar on seeing the Gamarála at a distance went up a tree. The Gamarála too came up to the tree and having tied his horse at the foot began climbing up. The beggar however getting down by a branch untied the horse, and rode off on it as fast as possible. The unfortunate Gamarála who was still on the tree finding out that nothing could be done; shouted out "Son-in-law, tell Kaluhamy that the jewels and clothes are from the mother, but the horse is from me."

කථාව දෝලාවෙන්, ගමන පයින්.

To go on foot after talking of going in a palanquin.

කතොත් මොනරමිහලු නොකතොත් කපුටුමිහලු.

What one has a desire to eat is to him peacock flesh ; what one has no desire to eat is to him crow flesh.

කසාකසා කස්බෝවේ, බසින්බසට බස්බෝවේ.

The more you scratch the more you will have to scratch; the more you talk, the more you will have to talk.

කටින් බතලකොළ සිටවනවා වගෙයි.

Like planting potatoe leaves with the tongue.

කසලගොඩේ තිබුනත් මැණික මැණිකමයි.

Though it lie in a heap of filth a jewel is a jewe for all that.

කාගෙ පසිසෙත් හුනුපොඩි තිබෙනවාලු.

In every one's betel-bag there are scraps of chunam.

කාසිපහට වෙස් දහයළු.

The possessor of five coins puts on twice as many airs.

---

කිකිලි තාරා බිත්තර රැක්කා වගෙයි-යන්තම් දැඩි වුනාම කුකුල් රැලට එක්නොවී තාරා රැලට එක් වෙනවා.

Like the hen hatching duck eggs.

කිඹුලා අල්ලනවා ඉවසතත්, කොහිලකටු ඇනෙන වා ඉවසන්ට බැරිළු.

Even if you could suffer being caught by the crocodile, you cannot endure being pricked by cohile (*Draxontium spinosum*) thorns.

කිඹුලාට මඟුල් ජෝඩුකලා වගෙයි-නරියා කිඹුලාට එ ගොඩින් මඟුල් ජෝඩුකරන්ට යනවයි කියකියා, දිනෙත් දින මනාලීගෙ පියා සම්බවුනේ නැත-මාමා සම්බවුනේ නැත-අය්යා සම්බවුනේ නැත, යනාදී බොරු උත්තරදිදී කිඹුලාගෙ පිටඋඩින් එතර මෙතරවී ගොස්, ගෙරිකුණ කා ඉවරවුනද මෙතරව ගඟේ ඉන්න කිඹුළන්ට මොන මඟුල් ද කියා නරියා ගියාළු.

Like arranging a match for a crocodile.

A cunning fox who had seen the carcase of a bull on the bank of a river, crossed the river every day on the back of a crocodile on the pretence of going there to arrange a match for the crocodile, The fox kept on cheating the

crocodile for a length of time telling him that the bride's father was away one day, and the uncle on another &c. On the day he ate the last of the carcase, he ran away to the jungle saying in answer to the inquiries of the crocodile, "What marriages for crocodiles that live in rivers ?"

කිඹුලාගෙන් ගැලවුනත් හූනා ගෙදරයි-කිඹුලාගෙ දත් වැදුන කෙනෙකුගෙ ඇගේ හූනා පැවරු නොත් සුවනරන්ට බැරිලු.

Though you escape the crocodile, you will find the lizard at home.*

කිරි කලේකට ගොම ටිකක් ලූහනලා වගෙයි.

Like putting little cow-dung into a pot of milk.

කිරිදියෙනි දෙවීයත්, අඟුර සුදුවෙන කලෙක්නම් නැත්.

Though washed with milk charcoal will never become white.

කීවොත් සඟ නසී, නොකීවොත් වෙහෙර නසී.

If the matter be disclosed it will be ruin of the priest, if not it will be ruin of the Wihara.

[This is supposed to have been said by a person who saw a Budhist Priest eating a *Wihara* made of flour offered to Buddha.]

කුකුළාට ඉස්සරවෙලා පෙඳේ දිව්වා වගෙයි.

Like the tail running before the cock.

කුඩම්මත් ඇවිත් කැවුම් පුන්චිනලා වගෙයි.

Although the Aunt had come the cakes were made small.

[This was said by some children, when their Aunt, whilst assisting their mother in making cakes, made smaller ones.]

* See Note 6.

කුදු මිනිහාට කෙලින්වෙලා යන්ට කියා බලකලාට යන්ට පිලිවන්ද?

Could a hump-backed man walk erect though you force him to do so?

කුඩා ඇමක් දලා මහ මාළු මරන්නා වගෙයි.

Like catching a big fish with a small bait.

කුණුමාළු ඔතාපු කොලේ වගෙයි.

Like the leaf in which putrid meat had been wrapped up.

කුඹුරේ අලි කෑවාට ගමේ තිබුන වංගෙඩි බැන්දෙව්වා වගෙයි.

Like tying up the paddy-pounders of the village because elephants ate up the corn in the field.

කුලාව අනිනොත් මඩේදිළු.

A blow to a wild bull should be given when he is in the mud.

කුලීකුරක්කනට ගොස්, ඉම්ගම් කුමටද?

Having come to thrash kurakkan for hire, why inquire after the boundaries of the Village?

කූඩැල්ලා මෙත්තේ ඉන්දුවාට ඉදීද?

Will a leech remain on a mattress though placed on it?

කූඩැල්ලාගෙ මූනට දෙහිඇඹුල් මිරිකුවා වගෙයි.

Like squeezing lime juice into the face of a leech.

කූඩැල්ලා එකපලක් අල්ලාගණ අනින්පල අත්හරිනවාලු.

The leech lets go his hold of one place when he has fixed himself on another.

කෙතට බැඳි පඹයා වගෙයි.

Like the scarecrow in a paddy field.

කෙතේ මුවෝ කෑවාට ගෙදර තිබුන ගෝණහමට තඩිබෑවාලු.

Like beating the elks'-skin which was at home, for the damage done by deer to the crop.

කොකාට වරයක්නම්, තිත්තයාටත් වරයක්ලු.

If there is a time for the crane, there will be a time for the thitthaya as well.

[*Thitthaya* is a kind of very small river fish.]

කොකා දිය සිඳෙනකල් බලාඋන්නා වගෙයි.

Like the crane waiting for the drying up of the river.

කොණ්ඩේ ඇත්නම් හතරනවම බැන්දැකිලු.

If you have hair, you can tie it in all four directions.

කොතන; කාසි, එතනට වාසි.

Where there is money, there will be gain too.

කොපමණ වතුර ගැලුවත් ගෙම්බිත්තාගෙ කරවටලු.

However high the water may rise, it will only be up to the neck of the frog.

කොපමණ සාගින්වුවත්, සිංහයා තණකොළ නොකයි.

However hungry a lion may be, he will never eat grass.

කොපමණ වරුෂාව තුබුනත්, කැඳෙත්තා දියපිපාසයෙන්ලු.

However much rain there may be, the Kendetta is always thirsty. *

කොරේ පිටට මරේ.

The pains of death in additicn to lameness.

කොහොඹගහට කරිවිලවැල ඒතුනා වගෙයි.

Like the cariville creeper *(Memordica Charantia)* entwined round a Margosa tree.

[Bitterness is characterstic of both the Cariville and the Margosa ]

කොහොඹ ගහේ උපන් පණුවාට තිත්තනැතිලු.

Bitterness is of no consequence to a worm born in a Margosa tree.

---

* See Note 7.

කැඳත් ඕනෑලු රැවුලත් ඕනෑලු.

Both are necessary the beard as well as cunjee.

කැස්බෑවී බිත්තර සියගණනක් ලා, කිසි ශබ්දයක් නොකරතත්, කිකිළි එක බිත්තරයක් ලා ගම් කීපයකට ඇසෙන්ට ශබ්ද කරණවාලු.

The tortoise makes no noise even after laying hundreds of eggs, but the cackling of a hen who has laid one egg, could be heard in several villages of the neighbourhood

කෑම හිඟයෙන් කෙට්ටුවෙච්ච සිටි බල්ලා වගෙයි-බ්‍රාහ්මණයාගෙ ගෙදර ඉන්න බල්ලා ඉතා කෙට්ටුව සිටිනාවිට, තවඑකේ මම ඉන්න ගෙදර බොහොම කෑම තිබෙන නිසා උඹත් එයි යමන් කියා මිත්‍ර බල්ලෙක් ගම්ගෑසුවාම, මම ඉන්නේ බ්‍රාහ්මණයාගෙ ගෙදරය, ඔහුට තරහගියාම බ්‍රාහ්මණදේවිට බැල්ලිය කියා බනිනුය-ඒ වෙනේ හැටියට බ්‍රාහ්මණදේවි මගෙ දියනියෝය. එවිට බ්‍රාහ්මණයා මගෙ බෑනාය, එබැවින් මම නොයමි කියා මාන්න අහංකාරයෙන් ඉඳ කෙට්ටුව සාගින්නෙන් මැරුණාලු.

Like the dog that was getting lean through want of food.

A friendly dog who had observed the dog of a certain Brahamin to be very lean asked the latter to come to his master's house where abundance of food could be had. The lean dog replied "I am living in a Brahamin's house & when the Brahamin gets angry he calls his wife a bitch; and thus she is my daughter and the Brahamin my son-in-law. On this account I cannot leave the Brahamin's house." The dog thus died of starvation through his love of vain-glory.

ගඟට ගේදුමට ඇඟ නොසෝදූ ඉන්නා වගෙයි.

ගඟෙන් එගොඩ එළිය දැක මෙගොඩ ඉඳගෙන සීත තැපීමට අතපෑවාලු.

Like the person on the bank of a riverwho at the sight of a fire on the opposite bank, stretched out his hands with the object of warming himself.

ගතේ යිල්ල යකාට පිළිම් අග්ගලාවලු.

An image is like an aggalawa to the Devil who has swallowed down a Budhist Priest.

[*Aggalawa* a kind of sweetmeat made in the shape of a ball.]

ගන්නා ළිඳට දිය උනනවාලු.

A well from which water is constantly drawn, always gets fresh supplies.

ගමට අවලමන් ගහට ඇහැල්ලුවන් විනාසලු.

A vagabond is the ruin of a village, and a parasite of a tree.

ගමරාළට කුරහන් ඇති බව දතෙන් පෙනෙයි.

A rustic who has kurahan could be made out by his teeth.

ගමරාළගෙ වංගෙඩිය වගෙයි.

Like the Gamarala's paddy-pounder.

A certain young man visiting his intended bride's house for the first time, was offered a paddy-pounder to sit upon by his mother-in-law. A little while after, the mother-in-law wanted the paddy-pounder in order to get some paddy down from the loft. So she asked the young man to get up for a while, and after finishing her business allowed the young man to resume his seat. After the paddy was dried in the sun the paddy-pounder was wanted a second time, to pound the paddy in. The young man being asked a second time to get up, left

the house in disgust, observing that there was but one paddy-pounder, to sit upon, to stand on, to pound paddy in &c.

ගමමායිසා කැප්පුවා වගෙයි-ගමරාලගෙ රැවුල කපන පනික්කියාට අවුරුද්දට වී මල්ලක් දෙනවා-එක්දිනක් පනික්කියා එනවිට ගමරාල ගෙදර නැති නිසා, ඒ වෙනුවට ගමමායිසා තොන්ඩේ කප්පවාගෙන ඈ කළ නුවණේ පාරම්බෑකළාලු.

Like the Gama-Maiya's shave.

A certain Gamarála used to give his barbar a bag of paddy every year for shaving him. When the barber came to the house one day during the absence of the Gamarála, the Gama-Maiya got her own head shaved in place of her husband's beard and boasted of her wise act on her husband's return.

ගමමායිසාලා දෙන්න රාලලාගෙ සමර්ථකම් කිවා වගෙයි-වෙන කාටවත් කියවන්ට බැරි අන්දමට, මගේ රාළ ලියනවායයි එක ගෑනියක් කිවාම, මගේ රාල ඊටත් වඩා සමර්ථය, උන්නැහෙටම කියවාගන්ට බැරි අන්දමට මගෙ රාල ලියනවායයි අනිත් ගෑණි කිවාලු.

Like the respective accounts two Gama-Maiya's gave of the abilities of their husbands.

When one of them said "My husband is very clever, for what he writes nobody else could read," the other observed "My husband is cleverer still, for what he writes, he himself cannot read."

ගමරාලගෙ වෙඩිල්ල වගෙයි-ගමමායිසා සත්තුවුනාම ගොස් කැලේ සැඟවෙන නිසා, කොතනා සිටිනත් ඔහුගෙ තුවක්කුව වදින බව පෙන්වන පිණිස, ඈ නාදී සතෙක් වෙඩ්තිබා කැලේ සඟවා ඇවිත්, ගෙදර ඉඳ වෙඩිල්ලක්තිබා, අන්න අස වල් නැත ඉන්න සතාට මම වෙඩිතිබ්බායි කියා

වැඩකරුවා ඇරියාම, සම්බව් ගෙනාදුසිට ඈ කැලේ සැඟවීමට ගියේ නැත්ලු.

Like the Gamarala's shot.

The wife of a certain Gamarâla was in the habit of hiding herself in the jungle whenever she happened to fall out with her husband. The Gamarala devised a dodge in order to make her give up the habit by making her believe that he could shoot anything with his gun, wherever it may be. Having shot an animal at a distance, he hid it in a jungle. After returning home he fired his gun and ordered his servant to go to a certain place and fetch the animal that was killed by the shot. The servant went to the place he was asked to go and brought back the animal. Never after this did the Gama-maiya resort to her old habit of hiding herself in the jungle.

හාමිරාළට ඇවිලූ පහනෙන් සේවායත් එළිබලනා වාලු.

The lamp lit for the headman's use, gives light to the lascoreen too.

ගම්මිරිස්ඇටේ සැර දතෙන්තේ විකුවාමලු.

How hot a pepper seed is, could only be made out by biting it.

ගලපිට වපුලා වගෙයි.

Like sowing on a rock.

ගල හොඳනම් පොළත් හොඳඑ

If the grinding stone is good, the cocoanut that it grinds too, will be good.

ගලපිට පොර හාද පොර නොවෙයි.

A struggle on a rock is no friendly-struggle.

ගලායන වතුරෙන් දෝතක් ගත්තත් ලාබලු.

It is a gain to take even two handfuls out of water that is running to waste.

ගලෙන් පට්ටා ගන්ට හැත්තරන්නාක්මෙන්.

Like the attempt to peel off the bark from a rock

ගල් දහයක් ගැහුවොත් එකක් වදීලු.

If ten stones are thrown, one would hit the mark.

ගහට හෙනෙත් පැණිවරකාව බලන්නෙත් නැත්ලු.

The thunder-bolt will not regard even a sweet-jack tree.

ගහ දන්නාට කොළ පාන්නේ කුමටද?

What is the use of showing the leaves to one who knows the tree.

ගහන්ට ගහන්ට වඳිනා එකත්, වඳින්ට වඳින්ට ගහනා එකත් දෙන්නම මෝඩයෝලු.

He that cries for mercy the more he is beaten, and he that beats the more, the more his victim cries for mercy, are both fools.

ගහෙන් වැටුන වඳුරා රැලෙන් අත්හරින්නා වගෙයි.

The monkey that falls down a tree is forsaken by its gang.

ගහෙන් වැටුන මිනිහාට ගොනා ඇන්නා වගෙයි.

Like a bull butting a man who has fallen down a tree.

ගහේ කටු උල්කරන්ට කමිනැහැ.

No need of sharpening the thorns of a tree.

ගහේ මුලින් නොගොස් අගින් යන්ට ගියා වගෙයි.

Like attempting to get on a tree from the top, instead of from the bottom.

ගලේ හිස හැපීමෙන් හිස පොඩිවෙනවා මිස ගල පොඩිනොවෙයි.

If the head is dashed against a rock, the head but not the rock will get smashed.

ගහයට වැසි දෙකලු.

A shower is doubled underneath a tree.

ගිනිපෙනෙල්ලෙන් බැටකාපු එකා කණාමැදිරියාට
ත් භයලු

The man who has been beaten with a firebrand; dreads the sight of a fire-fly.

ගින්නක් නැතුව දුමක් නැතිලු.

There cannot be a smoke without a fire.

ගින්දරේ පණුවෙක් දැම්මා වගෙයි.

ගිය ලුලා මහළුවාල.

The Lula (*Cabul*) that escaped, is said to be the bigger one.

ගිය හකුරට පාඩන්නේ, තිබෙන හකුරු රැකගනන්
නේ.

Cry not for the juggery you have lost, but take care of the juggery you still have.

ගිය නුවණ ඇතුන් ලව්වාවත් අද්දවන්ට බැරිලු.

You cannot draw back past wisdom, even by elephants.

ගිලිමලෙත් ඇතිලු දතසුද්දෝ.

Even in Gilimaley could be found people with white teeth.*

ගිරේට අහුවුනු පුවක්ගෙඩිය වගෙයි.

Like the areacanut caught in the cutter.

ගුරුන්ටත් අකුරු වරදිනවාලු.

Even teachers miss letters.

ගෙට නිවට එලිපත්තලු.

The threshold that is inferior to the house.

ගෙදර මහ පොතක් ඇත එකක්වත් මතක නැත කී
වා වගෙයි

You have a big book at home, but you cannot recollect any thing.

ගෙවලත් මල්ලේ මීයො දැම්මාවගෙයි.

ගෙම්බෝ ලහෙන් මනින්නා වගෙයි

Like measuring frogs with a laha †

---

* See Note 8,

† See Note 9.

ගෙරි කුණට කපුටෝ වහන්නා වගෙයි

Like crows flocking round the carcase of a bull.

ගෙරිමස් කනත් කුලෙල් එල්ලාගෙණ කන්නේ නැති ලු.

Those who eat beef do not keep it hanging about the neck whilst eating it.

ගොනා වනයින්නේ, කවුඩා මස්ගින්නේ.

The bull suffers from the pain of his wound, and the crow with a longing to feed upon it.

ගොනාපිට හකුරු පටවන්නා වගෙයි.

Like loading a bull with juggery.

ගොරක කාපු රිලවා වගෙයි-ඇඹුල නිසා දත හිරි වැටී නිසවායාණ ඉන්නවාලු.

Like the monkey that has eaten goraka(*Gam-bog.*)*

ගොලුවාගේ සින්දුව බිහිරාට ඇසී අත්පොලසන්දුන් නාය කියන්නා වගෙයි.

Like saying "The deaf man on hearing the song of the dumb man clapped his hands for joy."

ගොලුවා දුටු සවප්නය වගෙයි.

Like dumb man's dream.

ගෝනාගලට රැලනැඟුවාට නොදැනේව්-ඒ ගල තිබෙන්නේ පානාදුරමෝය ඉදිරිපිට මුහුදෙයි.

The Gonágala does not feel the beating of the waves. †

ඝෝෂා අකුරු ලීවා වගෙයි-රටක හොඳ සිටි පුත්‍රයා ලොකු අකුරෙන් ලියුමක් ලියද්දී මිත්‍රයෙක් ඒ දැක මේ මොකදැයි ඇසුව්ට, මගේ අම්මාගෙ කණ් ඇසෙන්නේ නැති නිසා ඝෝෂා අකුරෙන් ලියනවයි කිවාලු.

Like writing noisy characters.

A son who was in a distant country was observed

---

* See Note 10.

† See Note 11.

by a friend write a letter to his mother in large characters. On being asked why he wrote such big characters, he replied, 'As my mother is deaf, I write in noisy characters'

ගැරඬි මරා පව් ගත්තා වගෙයි.

Like sinning by killing rat-snakes.

ගැරඬියා නයා කරන්ට නොහැකිලු.

It is impossible to make a rat-snake a cobra.

ගැටිය කරේ හිටිය කථාව වගෙයි–එක මිනිහෙකුට ඔහුගෙ ගෑණි ගහනබනිනකල ඉවසා ඉන්ට බැරිව, පැමිණි විපත කියන අදහසින්, දුරුරටක සිටින ඔහුගේ මිත්‍රයකු සොයා නොයස් කථාකරමින් ඉන්දද්දී, එම ගෙදර ගෑණි පුරුෂයාට හට්ටියකින් ගැසූවිට, ගැටිය කරේ හිටියාම, යහළුවේ! මෙලෙස දේවල් දැකලා ඇද්දැයි ඇසූවිට, ඔහොම ගැහුම් අප රටෙත් සිඩවෙනාවා නමුත්, නුඹුත් ගැටිය කරේ හිටියා දුටුවේ අදය කීවාලු.

Like the story of the brim round the neck.

A certain man being unable to suffer the ill-treatment he was subjected to by his wife, went to a distant country in search of a friend of his, with the object of acquainting him of his trubles. When the two friends were talking together, the wife of the latter came in a rage and struck his head with a chatty & the brim of which fell round the husband's neck. The unfortunate man turning to his friend asked him if he had witnessed similar things in his country. "Assaults are common enough in our country too, he replied, "but it is only today that I saw the brim fell round the neck."

ගෙරව් තරමට වැස්සේ නැතිළු.

The amount of rain is not proportioned to the violence of thunder.

තෘණ ඇති තැන හරකා කන්නේ නැතිලු.

Where there is grass, cattle do not graze.

තද සෙනහස දබරවලු, තද හුලඟ වැස්සවලු.

Excessive fondness precedes a quarrel; strong blowing precedes rain.

[Familiarity breeds contempt ]

තනි ගහ උයන්වෙන්නේ නැතිලු.

A single tree will not make an orchard.

තණ්හාවෙන් ඇත්තෑ සැතෙනවාලු.

Ambition begets vexation.

තමන් දරුවාගේ මස් කකෑයි කිවොත් අනුන්ගේ දරුවාගේ ඇටත් නොකාද ?

Will not the man who threatens to eat up the flesh of his own child, eat up the bones of another's child ?

තමන්ගේ ගමට වල්ලත්, අනුන්ගෙ ගමට පොල්ලත් එපාළු.

Vanity in one's own village, and insolence abroad are both objectionable.

තමන්ගේ ගෙයිදොර ඇරතිබා, අනුන්ගේ ගෙදර බල්ලන්ගහන්ට ගියා වගෙයි.

Like leaving the doors of one's house open whilst going to drive away dogs from a stranger's house.

තරුණ ගොන් සීහානවා මහළු ගොන් කණ් හලනවා වටින්නේ නැතිළු.

The ploughing of young bulls is not worth the shaking of the ears of old ones.

තුත්තුකුඩි ගියත් ඒ අතපයමයි.

Though gone to Tuticoreen, your hands & feet will remain the same.

තෙම්මිච්ච කුකුලාට සීත නැතිලු

A wet cock does not feel the cold.

ගෙල්පැණි නොනාග සත නැවුම් තැල්ලත් හොඳයි.

Even a small piece of sweetmeat for which you do not spend jaggery and oil is acceptable.

තොටගමුවේ උපන් නාට මොටද බණ බැරිනම්.

What is the use of being born at Totagamuva if you do not know Bana *

හැලෙන යකඩ දුටුවාම, ආචාරියා උඩ පැන පැන තළනවාළු.

When the blacksmith finds a malleable iron he hammers it with jumping

තැවැරුම්කාරයාගෙ මල්බලිය ඉස්සීමට හැටක් එක තුවූනාළු-ඉන්පසු තවෙකෙක් දුවැවිත් අනේ රේන්දමහත්මයා ! කලින් මට නොදැන්නුවා ග රිහැන කියා නොක්කඩු කිවාලු.

When there were sixty men assembled to raise a tavern-keeper's Malbalia, another man came up running to the tavern-keeper and said, "Ah! renter you have done wrong in not having informed me about this in time." †

තෑග්ගෙන් තෑග්ග උතුම් තෑග්ගලු.

A gift of a gift is an excellent gift.

---

දඩමී බල්ලෝ බැඳතිබාගෙණ, මගෝඩි බල්ලෝ ගෙණියා වගෙයි.

Like keeping hunting dogs tied up at home, and hunting with curs.

දත ඇතිදූ පොල් කන්ට කීවලු.

Eat cocoanuts while you have your teeth.

දත් තිහට මැද දිව ගැලවෙන්නාවගෙයි.

The tongue is safe though in the midst of thirty teeth.

---

* See Note 12
See Note 13

දඹුලු විහාරෙත් වැඳගණ තලගොයිත් මරාගණ එන්ට කිව්වාවගෙයි.

Like saying "Perform your devotions at Dambulu-wihara and on your return kill and bring some guanos. ‡

දරුකුණත් කපුටුකුණත් අහකලන්ට එපාලු.

Do not throw away a dead child and a dead crow.

දඬිම්මාගේ මුවාවෙන් සතුන් මරන්නාක්මෙන්.

දහට උදහස් නැතිලු.

No wrath against thousand men.

දහට අරණේ පන්සියේට දුන්නා වගෙයි.

Like buying for a thousand, and selling back for five hundred.

දහනවය විස්ස කළා වගෙයි,

Like changing nineteen into twenty.

දිමියා එල්ලෙන්නෙත් හපන්කමටය, බැරිනම්බුත් වේගෙටවද?

දිළිඳුකම ඉඹුල්පුළුන්වලටත් සැහැල්ලුයි.

Poverty is lighter than cotton.

දිනුම්පිලට හෝයියා කියන්නා වගෙයි.

දිව මුල මීපැණි තුබුනත් හෘදයතුළ විෂය.

Though there is honey at the root of the tongue, yet there is poison in the heart.

දිවුල්මල් ලබමැයි සිතා දිය ඇද්ද වගෙයි.

Like watering a wood-apple tree with the hope of getting flowers. §

දිවයුරැ ඉදිරියේ කොයේ බබලාද කණමැදිරියේ?

How can a fire-fly shine in the sun?

දිවියාවුනාට මොපද නිය නැත්නම්.

What is the use of being a tiger if there be no claws.

---

‡ See Note 14

§ See Note 15

දිවි දුටු මුවා වගෙයි.
Like the deer who has seen a tiger.

දිව් පමණටලු හති.
Panting will be proportioned to the distance run.

දියයටින් වෙඩිතබන්නාක්මෙනි.
Like shooting from under water.

දිය මිටිතැන්න් බසින්නා වගෙයි.
Water always flows down the lowest place.

දියේ ඇඳි ඉර වගෙයි.
Like a line drawn on water.

දිසාව හොඳ නමුත්, දසාව නරකනම් නිල ලබන්ට බැරිලු.
Though the disawa is friendly, yet if the time (*dasawa*) be unlucky, no rank could be obtained.

[Dissawa in the time of the Kandyan Kings was an official of high rank. The term is now applied to a Government Agent.]

දුප්පතුන්ටම වේයි අමාරුව.
Every difficulty is to the poor.

දුවන්ට ඇරලා වල්ගෙ අල්ලන්නා වගෙයි.
Like catching hold of the tail of an animal after allowing it to run away.

දුවන්නන් පස්සේ දිව්වා වගෙයි.
Like running after runners without knowing why they run.

දුවන්ට බැරි අයගෙ ලය ගලලු.
He has a heart of stone, who is not able to run.

දුවන මුවන් දැක නොදමන් නෙළූ පලා.
Do not throw away the herbs you have plucked at the sight of running deer.

දූවට අසුවූන සිවලා වගෙයි.
Like the Jackal cast upon an Island.

දූවිලි ඇවුස්සුවොත් ඔහට දූවිලි නගියි.

If you raise the dust, it will rise up to your head.

දෙපැත්ත දූන්තෙල් ගාන්නා වගෙයි.

Like daubing anything with Buffalo ghee on both sides.

දෙවේලේ දකින කුකුලාගෙ කරමලා, එවේලේ පෙනෙයි සකසේම සුදුවෙලා.

The comb of a cock seen twice a day will appear to be as white as a Conch-shell.

දැනමුත්තොත්, මෝඩවෙනවාලු.

Even wisemen are sometimes out-witted.

---

නාමින් කපුරැහාමි නමුත් කටනඳුසු

නම්බුව කබල්ගෑවා වගෙයි--වංශය හොඳ නිසා දිළිඳුකම් නොබලා දූ දීගදීමෙන් පසු මව්පියෝ දූව නිසත් දකිමට ගියද, කෑමදීමට නැති වේගයෙන් කබලක් ලිපතබා නම්බුව කබල්ගානවයි කියා කබල්ගෑවාලු,

Like one stirring up the honour in an old pan.

The parents who had given away their daughter in marriage to a poor man on account of his high birth, went to see the daughter sometime after the marriage. The daughter had nothing in the house to offer her parents to eat; so in a fit of rage she went and placed an old pan on the hearth and pretended to show as if she were stirring up its contents. When asked by the old pair what she was about, she replied "I am trying to fry the honour you got for me."

නාමින් කොස්වත්තේ, කම්ඩා කන්ට පොලොසුත් නැත්තේ.

Though by name it is Coswatte (*Jack Estate*) yet one cannot find in it even a young jack to eat,

ණයගත් අය ණයදුන් අයගේ වාලාය.

The debtor is the slave of the creditor.

නයාට පොල්ල වැරැද්දුවා වගෙයි.

Like missing the blow to a cobra.

නයාගෙ පැටවා ගැරඬිනාකරන්ට බැරිය.

It is impossible to make a young cobra a rat-snake.

නයා පෙණේකරණවා දැක ගැරඬියත් කැබලිත්තක්
ඩැහැගෙණ නැටුවාලු.

Having seen the cobra spread out its hood, the rat-snake also danced with a pot-sherd in its mouth.

නරියා කුකුලා කැලේ සඟවා පොල්ලෙල්ල ඩැහැගෙණ
දුවනවාලු.

The fox hides the fowl in the jungle, & runs about with a cocoanut husk in its mouth.

නාසෙන් ඉහළ ගැළු වතුර කොපමණ ගැළුවත් එකය.

It makes no difference if the water which is already above the nose, rises higher.

නිකම් යන්ට බැරි උමඟෙයි හුණුකුල්ලක් බදාගෙණ යන්ට කීවාවගෙයි.

Like asking a person to go with a winnow of chunam along a subterranean passage, which scarcely affords him a passage.

නිකම් පනිනා රිලවාට ඉණිමණ් බැන්දුවගෙයි.

Like making ladders for monkeys who can climb up without them.

නිකම් හඬන මුත්තාට මුනුපුරෙක් මැරුණා වගෙයි.

Like the death of a grand-son to a grand-father who weeps for nothing.

නිකම් නටන යකාට අඟුරු දුම්මල ඇල්ලුවා වගෙයි.

Like placing burning resin & coal before a devil, who dances without anything.

නිදන සිංහයා නැඟුට්ටුවා ගැරීම නුවනට හුරුනො
වෙයි.

It is unwise to rouse a sleeping lion.

නිදිමත සැප නොදනීලු.

One who is sleepy cares not for comfort and ease.

නිදිවරා ඉන්ට නොපිළිවන්නාම් වින්නඹුකමේ නො
යන්.

Do not turn out a midwife if you cannot remain without sleep.

නිවට ඇම්බැට්ටයාට එළුවත් නිකට පානවාලු.

The goat also offers his chin to an inexpert barber.

නිල ලැබීම නරකාදියටත් හොඳලු.

It is good to obtain distinction even in hell.

නියනැති දිවියා වගෙයි.

Like a tiger without claws.

නියඟට පැහුනා වගෙයි.

Like the untimely ripening due to hot weather.

නියපොත්තෙන් කඩනා ගහ පොරොවෙන් කපන්ට
අමාරුවුනා වගෙයි.

A tree which could at first be nipped with the nail; could afterwards with difficulty be cut down with an axe.

නුපුරුදු දීගයට වඩා පුරුදු කනවැන්දුම යහෙකි
ලු.

A single life is preferable to an unhappy marriage.

නුරුස්සන මිනිහාගෙ සෙවනැල්ලත් ඇදලු.

Even the shadow of a disagreeable man is deformed.

නූල් මලේ ඇවිල වාගෙයි.

Like the twist of a skein of thread.

නෙළුම්කොළේ දියබින්දුවමෙනි.

Like a drop of water on a lily.

නොකරණ වෙදකමට කෝඩුරුතෙල් හත්පට්ටයකු ත් විනස් ඕනෑලු.

නොඉව්ඩ්පච යනාගමනේ, සිමන්පච සම්භාවූනේ, ස ල්ලිදෙකේ රා අරගෙන, දෙන්නාබිබී සත්බුවුනේ.

නොදන්නා දෙමළ වර්ගෙ නාසනවාලු.

Tamil that one knows nothing about is said to be the ruin of his race.*

නොවපුර නොපැසෙයි.

No crops without sowing.

නොහොඳින් හොඳක් නොවේලු.

Nothing good will come out of evil.

නොයන ගමට කුමටද මග විචාළේ?

Why did you inquire about the way to the village where you do not intend to go ?

නැටුම් ගැහුම් කපුරාලලාටලු, බත්ටික ටිකිරිරාලලාටලු. [ටිකිරිරාලහාමි-යකුන්ට පූදන බත් උයන්නා-ඒ බත්කන්නෙත් ටිකිරිරාලයි]

Though the *Capurála* dances, *Tikirirála* gets the rice. ‡

නැට්ටුවා වැටුනත් අඩව්වලු.

Even the fall of a dancer is a somerset.

---

පිණිනා මුවාට උල්සිටුවන්ට කමෙක් නැහැ.

It is not necessary to plant stakes to injure a leaping stag.

පණ්ඩිතයන් සියයකුගෙන් දිනනත්, මෝඩයෙකු ගෙන් දිනන්ට බැහැ.

Though you vanquish in argument a hundred wise men, no victory could be gained over a fool.

පදුවන්ට මොන සුදු හරක්ද

What white cattle for *Paduwás*. †

---

* See note 16    ‡ See note 17    † See note 18

පර අබසා දොසමෙරසා පෙනෙන්දූයි, තම මෙරසා දොස අබසා පෙනෙන්දූයි.

Ones own fault though it is as big as *Mahaméru* appears to him as small as mustard seed, while the fault of another which is as small as a mustard-seed appears as big as *Mahaméru* ‡

පව්කාරයාගෙ හිස බූගෑද ගල්විශ්‍රාව වැස්සාලු

On the day that the sinner's head was shaved, there was hail

පව්කාරයා පොතනුස්සයි තඩිගෙණයයි.

The sinner will not take up a book, but will carry a load.

පඹගාලේ පටලැවුණ නරිනයිදේ වගෙයි.

Like a fox entangled in a thicket of Pamba [*Hydrogiosum pinnafitida.*]

පරංගියා කෝට්ටේ ගියා වාගෙයි- පුතිකාල්වරු
පළමුවෙන් කොළඹට ගොඩබෑස, කෝට්ටේ වැ
ඩහිටින රජ්ජුරුවන් දකිමට යන්ට පාර ඇසුවා
ම, එසිසිවි සිංහලයෝ, ගාල්ල මාතර ගිරුවා ප
ත්තුව එවට්ට ගෙණගොස් තුන්මස් තුන් පෝය
ක් ඇවිද්දවා කෝට්ටේට එක්ක ආවාලු-කොළ
ඹසිට කෝට්ටේට දුර හැතැප්ම හයයි.

Like the journey of the Portuguese to Cotta.

The first Portuguese who landed at Colombo, wishing to go to the residence of the Kandiyan King at Cotta engaged some Singhalese guides to conduct them there. These guides instead of taking them straight to Cotta (distant only 6 miles from Colombo), took them through Galle, Matara, and Giruwapattuwa and thus made them travel for three months and three weeks before they took them to their destination.

‡ See Note 19

පලඇති ගසේ කොයිසතත් වහනවාලු.

Every kind of bird will resort to a fruitful tree.

පතට ඉපදිලා දෙපතක් ගරණ්ට පිළිවන්ද?

Having born one for a quarter measure, could he expect to clean a half-measure ?

පහරපිට පහරදෙනවිට ගල්පර්වතත් ගමන්යන්ලු.

A successive blows will set even rocks in motion.

පාන්මඩු අස්සේ ගිනිමඩු පටන්ගත්තාවගෙයි.

Like commencing a *Pànmaduwa* * in the midst of a *Ginimaduwa.* †

පාන්ගෙඩියේ මසුරන් තබාදීලත් පව්කාරයාට නොලැබුනීලු.

Even after giving gold coins in the bread, the sinner did not get them.

පාවෙන පාවෙන කුණු බේරුවල් තුඩාවටලු.

Whatever rubbish floats collects at Béruwala point.

පාපයක් නැතුව සාපයක් කොයින්ද ?

Where is the curse that is not the consequence of sin ?

පාළුපැල් රැක්කාවගෙයි.

Like remaining in deserted watch-huts.

පිණ්ඇතිදාට ගොණත් වදනවාලු.

On a lucky day even bulls are said to bringforth.

පිනැත්තන්ට බුරණ බල්ලාගෙ කටේ දත්වැටෙනවාලු.

The teeth of the dog which barks at the fortunate will fall.

පිත්නැත්නම් සිත් කොයින්ද?

If there is no bile how can there be a heart ?

පියවරු ගොයිනැත්කලොත් දරුවන්ට කරල් ඇහිඳීමට ඉඩඇත්ලු.

If fathers cultivate the children will have a chance of gleaning.

---

† See note 20 * See note 21

පිරුණු කළේ දිය නොසෙල්වෙයි.

A pot filled to the brim does not shake.

පිඹුරා දඩයම වගෙයි-උඹු දරණු ගසා ඉන්න අතර ඒ දරණුව තුලට අඩය ගොසු සතෙක් ඇත්නම් ඒ සතාව වෙලමින් මරා ගිලිනවාලු.

පිස්සිගෙ පලාමල්ල වගෙයි.

Like a mad woman's bag of pot-herbs.

පීරට දත්ගහන්නා වගෙයි.

Like trying the teeth upon a file.

පුචි ලමයි නැති ගෙයි නාකි දනගාණවාලු.

Old people crawl about in the house where there are no infants.

පුහුල්හොරා කරෙන් දැනෙයි.

He who steals an ash-pumpkin will be betrayed by his shoulder.

පොරව කප්පර එද්දී අපව නහන්ට අපෙන් එකෙක් ඕනැයි කියා බැද්ද කැගැසුවාලු.

පැණිහැලියේ වැටිච්ච කුහුඹියා වගෙයි.

Like the ant which fell into a pot of honey.

පැමිණි දුක් පැණිරසලු.

Sorrows that have already befallen are sweet.

පැහෙන්ට ඉස්සර ඉදුනා වගෙයි.

Like ripening before arriving at maturity.

පැල්ලැග්ගා ගිනි තැප්පාට සිලව්ලු.

Opportunity to warm one's self, was the only advantage gained by remaining in the watch-hut.

පැහිමෙන් නරක්වෙන්නේ මනුෂ්‍යයා විතරලු.

Ripeness renders only man unsightly.

ප්‍රවේසමට තැබූ යකඩේ ඇලිනාවට සිටිනා වගෙයි.

ප්‍රයෝග භක්තිය තුන්ඉරට්ට පාපයවේ.

Hypocrisy is a three-fold sin.

බඩගිනි රස නොදනීලු.
Hunger knows no taste.

බඩගැලයාගෙ හමාසේ වැඩ පොලුකාරයාට එක පහරලු.
Six months labour of the potter, is one stroke to the man having a cudgel.

බතෙත් තිබුනොත් මිස හාලෙත් තිබුනාට පිළිනු නොවෙයි.
It is the boiled rice that is left behind and not the raw that will get stale.

බත්දුටුදා කොස් තිත්තවුනා වගෙයි.
Jack becomes bitter when rice is seen.

බත්මූනෙත් ඇත්මූන බිඳෙනවාලු.

බතේ අරුම දැනෙන්නේ හාමතේදිලු.
The utility of rice is known when one is starving:

බරවාකකුලේ හැකෑරිලා වගෙයි.

බලාකාපු තාසෙක් නොවෙයි.

බලල්ලු ලව්වා කොස්ඇටබැව්වා වගෙයි.
Eng: To make a cat's paw of any one.

බලුවල්ගේ ඇද හරින්ට බැරුවා වගෙයි.
The tail of a dog cannot be made straight.

බල්කෝලමට හැරගුනොත් අහුරගහපු තැනට යන්ට ඕනැලු.

බල්ලාට ලෙලිපොල් දුන්නාවගෙයි.
Like giving an unpeeled cocoanut to a dog.

බල්ලාට ඇති වැඩකුත්නැහැ, හෙමින් ගමනකුත් නැහැ.
Though the dog has no work, yet he never walks slowly.

බල්ලාටකිව්වාම බලුවල්ගේට කියන්ට කිව්වාලු.
The dog wanted the order that was given to him, to be given to its tail.

බල්ලා කකුළ හැපුවාට උගේ කකුල හපාකන්නේ නැහැ.

Though a dog bites one's leg, yet it's leg will not be bitten in return

බල්ලා ඉන්නාවිට පොල්ල නැහැ—පොල්ල තිබෙන විට බල්ලා නැහැ.

When there is a dog there is no club ; when there is aclub there is no dog.

බල්ලෝ බිරුවට චන්ද්‍රයා නොසලකයි.

The moon will not care about the barking of dogs.

බල්ලෝ බිරුවට අලි භයනොවෙත්.

The barking of dogs will not frighten elephants.

බල්ලෝ බිරුවට කන්ද කුඩානොවෙයි.

The barking of dogs will not make the mountain small.

භාෂාව ඉගෙණීමට ආසාව තිබූපමණින්ම පිළිවන්ද ?

Will the mere desire to learn a language enable one to learn it ?

බිහිරාට ගීතිකා මොටද ?

What music to a deaf man ?

බිහිරි අලියාට වේණා නාත්තාක් මෙනි.

Like playing the fiddle to a deaf elephant.

බුදුන්වැඳගෙන එනගමන් කෙමනත් බලාගන්නා වගෙයි.

Like examining the *Kemana* while returning from adoring *Buddha* *

බෙරවායාගෙ උගුලේ මොනා අසුවුනත් එකයි.

It is all the same whatever animal is caught in the tom-tom beater's trap.

බුදුන්ගේ පාත්‍රේ බින්දුවගෙයි.

Like breaking *Buddha's* bowl..

බොරදියේ දැම්මා වගෙයි,

Like putting in turbid water.

* See note 22

බොරුවට පණනැහැ.

A lie has no life.

බුදුන් අවවන්නොත් සඟුන් අවවන්නොත් මම බො
න රකැවේවය කියා බෙබද්දෙක් කීඑ.

බුදුවෙනකොටම මාර්ගඵලයක් කිවා වගෙයි.

බොල්ලැවා මලත් අදව් නැත්එ.

Although a man with projected teeth is dead, yet no one will believe.

බැද්දට පැවූ හඳවගෙයි.

Like the moon shining in a jungle.

බැරිදේ පිළිවන්ද දත්මිටි කෑවාට

Can you do what is impossible though you grind your teeth ?

බැලලී වදන්ට ඉක්මන්වූ තරම කියනොත් ඇස් ඇති
පැටව් වදන්ට මතකනැතිවුනාඑ.

The cat was in such a hurry to bring forth, that she forgot to bring forth young ones with eyes.

---

මකුනාගේ බඩේ නූල් සිඟවෙන්නේ නැතිඑ.

The supply of threads in the stomach of a spider will never fail.

මඩුකුඩන් හදනවිත්තිය කිවා වගෙයි-(මෙපමණ මඩු
කුඩන් හුඟක් හදන්නේ කුමටද කියා පාරේය
න්නෙක් ඒ ගෙදර තරුණීගෙන් ඇසුවාම ම
න්දන්නේ නැහැ- මඟුලක්එ-කාටඑ-මන් දන්
නෙ නැහැ මටඑ.

මඟුල් කෑමට ගොස් ඉලව් කෑම ලැබුනා වගෙයි,

Like the person who went to a wedding but had to partake of a funeral feast.

මඟුලේ හැඩ දැනෙන්නේ ළමයි හඬනවිටලු.

The nature of the marriage could be made out when children cry.

මඟුල් පාලුකරන්ට කිරිබත් පත්ත හැංගුවා වගෙයි.

මඟුල් කපුවාට හෙන හතක් නියමිලු.

Seven thunder-bolts fall to the lot of a match-maker.

මගේ අරක්කු බීලා මටම ගහනවයි කිව්වා වගෙයි.

Like saying "You strike me after drinking my own arrack."

මතු පැමිණෙන ලෙඩට බෙහෙත් කන්නා වගෙයි.

Like taking medicine in anticipation of a disease.

මඩේ හිර්වුණු ඇතා ගොඩගන්ට ඊට වඩා බලසම්පන්න ගජේන්ද්‍රයකු ඕනෑ කරයි.

A stronger elephant is necessary to pull another elephant out of the mud.

මම පොල් හොරකම්කලා නොවෙයි, එල්ලත් බැස්සයි කිව්වා වගෙයි.

Like the saying "I did not steal the cocoanuts but simply brought them down the tree."

මළගිය අයගෙ කේන්ද්‍රය බැලුවායින් කවරනම් ප්‍රයෝජනද ?

What is the use of consulting a dead man's horoscope.

මරපු කුකුලා ශුධකරන්ට නරියාට දුන්නා වගෙයි.

Like killing a fowl and handing it over to a fox to clean.

මරෑ ඇති තැන් දනී පය දෙපතුල්ලා.

The soles of ones' feet only will know where he is to die.

මරුවා අඳුව බාධා නැතිලු.

Death when it comes meets with no opposition.

මහනෙල් මල් විලෙත් මැඩියෝ ඉන්නවාලු.

Even in the lotus-pond there are frogs.

මහනෙල් මල ඉතා සුවඳ නමුත් එහි දණ්ඩ කොර හැකියි.

Though the lotus-flower is very sweet, yet its stalk is very rough.

මහ දැනමුත්තාගෙ නුවණේ වගෙයි–වස්සා සැලිය තුළ ඔළුව ලාගත් බව ගොස් කීවාම ඒ දැනමුත්තා ඇතාපිට නැගී වත්තට එන්ට තාප්පේ කඩවා ඇතුල් මිදුලට එන්ට ගෙයක් කඩවා ඇවිත් වස්සාගෙ කුලල කප්පවා සැලිය බිඳ ඔළුව අරන් මම නැතිද තොපි කොහොමද කියාගෙණ ගියාලු.

Like the wisdom of Mahadenamuttha.

A certain man whose calf had put its head into a pot, consulted Mahadenamuttha (who was proverbial for his wisdom) as to what means should be adopted in order to take the calf's head out without any injury either to it or to the pot. The sage got on his elephant and rode in the direction of the man's house. In order to enter the garden he had to get a wall broken down and a house too to gain the inner compound where the calf was; then he ordered the calf's neck to be cut asunder and after breaking the pot he took the head out and gave it to the owner, saying "How will you get on when I am dead and gone."

මහ නැව් යන මුහුදේ කුඩා ඔරුත් යනවාලු.

Small boats too go in the sea where big ships pass.

මහෝදර ලෙඩා කොතරම් දිය බීවත් ඇතැයි යන තෘප්තියට නොපැමිණෙයි.

No amount of water will satisfy the thirst of a man suffering from dropsy.

මහලුවූනාම යකාත් තපස් රකිණ්ට කැමතිලු

Even the devil wishes to be a hermit in old age.

මාතර ගොස් උගත්තෙත් පොල් ගාණ්ට විතරක්ද ?

After going to Matara too, have you learnt only to scrape cocoanuts ?

මාළිගා ඇති රටේ දිළිඳු පැලුත් තිබෙනවාලු.

In a country where there are palaces, there are miserable hovels too.

මිත්‍රයෙක් අමිත්‍රකරගන්ට මනාපනම් ඔහුට පනමක් නයට දෙන්ටලු.

If you wish to make a friend unfriendly, lend him a fanam.

මිටේ උන් කුරුල්ලා ඇරලා ගහේ උන් කුරුල්ලා ඇල්ලීමට ගියාක්මෙනි.

Like leaving the bird in the hand, and trying to catch the one on the tree.

[A bird in the hand is worth two in the bush.]

මීහරකාගෙ කරේ එලහරකා ඇඳුවා වගෙයි.

Like yoking a bullock with a buffaloe.

මීයක් කැඩූ කෙනෙක් අත ලෙවකත්ලු.

He who breaks a bee-hive, will lick his hand.

මීයාට මරළු බළලාට සෙල්ලමලු.

Death to the rat and play to the cat.

මුහුන්මිත නොදී වැහිපස්ස එවඤ්ඤයි කීවාලු.

Like refusing a little leaven and promising to send the she-calf.

මූණින්නැවූ කළේ වගෙයි.

Like the pot placed with its mouth downwards.

මුව දඩයමට යන්නේ ආනම් කන්ටමයැයි ?

Is it only to eat *ánam* that one goes a deer hunting.*

මුහුදු වතුර බීවාට පිපාස නොසංසිඳෙයි.

Sea water will not quench one's thirst.

මුහුද කැඳවුනත් කෙටි හැන්ද මා අතෙයි කිවා වගෙයි.

Similar to the saying, "Even if the ocean be turned into cunjee, the short-spoon is in my hand."

මුහුණ සේදූ තරමට ඇසට සනීපළු.

The oftener the face is washed, the more beneficial it will be to the eye.

* See Note 23.

මූරුංගා ගහ කැපූ කථාව වගෙයි-වත්තේ තිබූන මූරුංගා ගසේ මල් දුටුද, ඒවා කරල්වූනාම මිටි බඳින ප්‍රමාණයත්, විකුනන මිල ගණනුත්, ඒ මිලයෙන් වෙළඳම්කරණ හැටිත් මිල වැඩිකර නැව් තනවා රටින් රට වෙළඳාම් කරවා ගෙණෙන බඩු දමීමට ගුදම් ඕනෑ බවත් සිතා, ගුදමට එන්ට පාර හැදීමට අවසිරව පෙනී ගියනිසා ඒ මූරුංගා ගහ කැපුවාළු.

Like the cutting down of the drum-stick tree.

A person who had a drum-stick tree in his garden when he saw the first blossoms on it, fell to thinking about the way the drum-sticks they would produce, should be tied into bundles ; from that he passed on to a speculation about the profits that would accrue to him by selling them, and the trade he could carry on with this money, and the extensive trade which in course of time he would be able to carry on with foreign countries with ships of his own ; and the store-houses that should be built for foreign goods ; and as the drum-stick tree seemed to obstruct the way to the store-houses he cut it down.

මෙහෙම ගෙදරකට කුළු තුනක්වත් ඕනෑයි කී විත්තිය වගෙයි—වශීාවක් වැහැගණ එද්දි පාරේ යන්නෙක් ඒලඟ ගෙදරට ගොඩනැඟුනාම, ගේ නොමෙනනිසා ඒ ගෙදර දෙන්නා දෙමල්ලෝ කුළු දෙකක් ඉසලා ඉඳගණ අතේ ! උඹට දෙන්ට කුල්ලක් නැත කීවාම, මෙහෙම ගෙදරකට කුළු තුනක්වත් තිබෙන්ට ඕනෑයි කියා මගයන්නා තෙම්තෙම් ගියාළු.

Similar to the sayiug. "There ought to be at least three winnowing fans for a house like this."

[A passenger who stepped into a road-side house to take shelter for the rain, found the husband

& wife under the shelter of two winnowing fans as the roof of the house was leaking. On seeing the stranger the two occupants of the house exclaimed "pity that we have'nt another winnowing fan for you." The passenger on hearing this, went away in the rain saying "there ought to be at least three winnowing fans for a house like this"

මේ මිනිහා මා මරණවෝ කියා මූරගෑනු විත්තියලග ගෙදර ගෑණිට ඈගෙ සැමියා බීගණවිත් කුම් බැට දෙනාවිට තෑනයත නිසා, එලෙස මාත් නයක් මඹත් ගනිමැයි සිතා ඈ ගෙදර තිබෙන වත්ගෙඩි කොටේ උඩඑල්ලා විසිතර පිට පාමින් ශබ්දකර එලෙස කෑගෑනුවාළු.

මෝඩකමක් කරලා දූතාමූතුවෙන්ට ඕනෑළු.

It is by committing a foolish act that one learns wisdom.

මැණික්ගලේ පය හැපුනාව කණා ඇඳිනලා ගණීද ?

Will a blind man make out and pick up the precious stone he pitches his foot against ?

මැටිපෙත්වත් මොකද බලලා මීයා ඇල්ලිනම්.

If the cat catches rats, it matters not that he is made of clay.

---

යකඩ දැව්ච ගෙයි ඉඹුල් පුළුන් කොයින්ද ?

Could there be cotton in a house where iron has been consumed ?

යකාට භයනම් සෝම්පලේ ගේ හදන්ට එපා.

Do not build your house in a cemetery if you are afraid of the devil.

යක්දරුවෝ වාති යක් මව්පියෝ නොවාති.

Even the most depraved parents have an affection for their children, but the reverse is true in the case of depraved children.

යකුන් නැටුවාට පසු කට්ටාඩියාව වහුකණුවටත් එපාළු.

The devil dancer, after the close of his ceremonies, is not wanted even to be used as a post to tie calves to.

යක්ෂයා පඤ්ඤවුණොත් නරකාදියාම ලේසුයි.

If the devil becomes your god-father you can go to hell easily.

යන යකා කොරහත් බිඳගෙණ ගියාළු.

The departing devil broke the chutty on his way.

යකුන් සේවයකළෝ ඇත්නම් පැරදුනෝ මිස දිනූවෝ නැත.

Those who serve devils never come off victorious but are always vanquished.

යන්නේ කොහාටදැයි ඇසුවාම මල්ලේ පොල්ය කීවාළු.

A person on being asked where he was going, said he had cocoanuts in his bag.

යාළුවෝ දහට පොල් දහ බෙදුවා වගෙයි.

Like distributing a thousand cocoa-nuts among a thousand friends.

යුද්දෙට නැති කඩුව කොස් කොටන්ටද ?

Are you to cut jack with the sword that is not used in the battle?

---

රත්රන් ගෙමඩියා මැකූ කථාව– එක් ස්ත්‍රියකුට පරම්පරාවෙන් උරුමව තිබුන රත්රන් ගෙමඩියා මකා ආයිත්තම් තනාවාගැණීමට සිතූ නමුත්, බඩාළුන්ට දීමෙන් වංචාකරන සිතා තම පුත්‍රයාට රත්රන්වැඩ උගන්වා ආයිත්තම් තැනීමට එරෑඩාරදුන්නාම, ගිනිකබලේ පස්යට කලින් ගෙමඩියක් වලලා තිබා ගිනිපිඹිනවිට උෟ පැනැස්දී 'අම්මේ රත්රන් ගෙමඩියා පැනානන්නා' කියා පෙන්නුවාළු.

රදවුන්ට රෙදි දීලා කොක්කු පාරේ යන්නාවගෙයි.

To go after cranes, after giving the clothes to the dhoby.

රදපිරුවටේ වගෙයි.

Like a cloth hired out by a dhoby.

රයිගමයා සහ ගම්පලයාගේ කථාව-මෙම දෙදෙන එකතුව රන්බඩු පෙට්ටියක් සොරාගෙණ ගොස් මුහුදු වෙරළේ වලලා රෑපිට මෙම දෙදෙන නිදාගන්න අතර, එකෙක් නැගිට හාරගෙණ එම පෙට්ටිය මුහුදේ කරවටක් ගැඹුරේ ගිල්ලවා අවුත් නිදාගත්දදී, අනිකා පිබිද බැළුකල පෙට්ටිය නැතිබව දැක මොහු අනිකාගේ ඇඟ ලෙවකා බලා මුහුදේ සඟවාපු බව සහ ගැඹුරේ ප්‍රමාණයත් තේරුම්ගෙණ, මුහුදේ බැස සොයාගෙණ පිදුරු ගොඩක් අස්සේ සැඟවුනාලු-එව්ට අනිත් අය ලයේ අත්සපාගෙණ, තම මිත්‍රයා පෙට්ටියත් සමග පිදුරු ගොඩක් අස්සේ සැඟවෙන්ට ඇතැයි සිතා 'සොකඩයක්' (සොකඩයනම් ලිවලින් සාදා හරකාගේ බෙල්ලේ එල්ලන ශබ්දපාන එකකි) බෙල්ලේ එල්ලාගෙණ සොයායන විට, පිදුරු ගොඩ අස්සේ ගැත්තීගෙණ උන් ඒ සොරා හරකෙක් පිදුරු කන්ට ආවායයි සිතා ජඃ ! ජඃ !! කෙං මියා කියා දැක්කුවාම දුවගොස් බදාඅල්ලාගෙණ පෙට්ටියේ තිබුන රන්බඩු දෙන්නා එක්ක බෙදා හදාගෙණ ගියාලු.

රජවුනත් බල්ලා සෙරෙප්පු කනවාලු.

The dog even if he becomes a king will bite sandals.

රජකම්කරණ්ට බැරිනම් වෙදකම්කරණ්ටලු.

If you cannot become a king then take to the healing art.

රජකම්ගෙන්ට සිංහයා වෙන ආ ඌරාගේ කථාව--එක්
තරා වනාන්තර වාසයකර උන් 'සෙවනකේසරී' නම්
සිංහරාජ මහළු වයසට පැමිණ, එම වනාන්තරය
දිමා සුරුස්සෙන් කැඳවාඑන්ට 'වීරසාර' නම්
සිවලාට අවසරලැබී, ඊට කෙනෙක් සොයා යන
කල්හි රැලට නායක වල්ඌරෙකු සම්බුවී ඇසු
බෝවත් මාමන්ඩියේ කියා ආචාරකොට, අප සිං
හරජ මහළුබවට පැමිණියෙන් එම රජකම දෙ
න්ට තමුසේට කැඳවාඑන්ට මට අවසර ලැබුනයි
කීන-එබස ඇසූ වල්ඌරා ඊට කැමතිවී සිවලා
සමග සිංහගුහාවට ගියවිට, මහළු සිංහරජ වල්
ඌරාට පැන්න නමුත් මරන්ට නොහැකිව යන්
නම් පණගලවාගෙණ ගියයින් පසු ; ආයෙත් සිව
ලා වල්ඌරා කරා ගොස් තමුසේගේ හය තිබ්බින
කම් දැනගැණීමට උත්සාහසේකළ සෝදිසියට
හයවුනා මරදය කියා අහයදී ආයෙත් එක්ක ආ
විට, සිංහයා ඌරාට පැන මරාගෙන කාන්ටගොස්
එන්ට ප්‍රථම නරියා ඌරාගෙ අඟුරුම ඒ කිනිත්
න ඇද කැවාඒ-ඉන්පසු සිංහයා ඇවිත් පරීක්ෂා
කරබලා අඟුරුමාඒ නැති බව කීවාම, අඟුරු
මාඒ ඇත්තම් දෙවෙනි වතාවේ නේන බව සවා
මිදරුවන්ගේ තික්ෂණ කල්පණවට හැඟෙනාවා
ඇ.. කියා සිවලා ඇගට ඉනට තෙදනී වාගේ
උත්තරදී පැනගියාඒ.

රජවුනත් බල්ලා සෙරෙප්පු කනවාලු.

The dog even if he becomes a king will bite sandals.

රජගෙදර රන්කූඩුවේ රජභෝජන කනවාට වඩා
ගෝලේ එක හැඬලීමක් හොඳයි කියා ගිරවා කි
වාඒ

The parrot said that it was better for him to utter one note with his flock, than to live in a golden cage in the king's palace & enjoy delicious food

රජුන් සේවයකලෝ දිනුවොත් ඇති පැරදුනොත් ඇති.

There are losers as well as gainers among those who have served kings.

රජුන් යන මඟ දිලින්දෙත් යනවාලු.

Poor men also go in the same road as kings.

රජුන්ගේ කරුණාව උරුමයක් නොවෙයි.

The favour of kings is no inheritance.

රට වටකර වැටබඳිනත් කට වටකර වැට බඳින්ට බැරිලු.

A country could be hedged round about, but not the tongue.

රන් ආවුදෙන් ඇන්නත් රිදුම එකලෙසමයි.

